
ශ්‍රී.ල.නි.ප.

14 වන ජාතික සමුළු ප්‍රකාශණය

2003.06.22.




# ජන්ම හිමි

## අපේ නව මග

BKT 0244
26 /08 /2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
ජනාධිපති ලේකම් කාර්යාලය
09 JUN 2003
පුස්තකාලය

# ජන්ම භූමි

## අපේ නව මග

ශ්‍රීලනිප 14 වන ජාතික සමුළු ප්‍රකාශනය
2003 ජූනි මස 22 වැනි දා.

## ඇතුල් පිටු

1. අපේ නව මග

2. සාමානාත්මතාව තුළින් ජාතික ගැටළුවට විසඳුම්

3. දේශීයත්වය සමග බද්ධවූ නව ආර්ථික සැළැස්ම

4. ජනතාවාදී ලෙන්ගතු පාලනය

5. වගකීම් සහිත විවෘතභාවය

6. නීතිය හා සාමය සුරැකෙන සමාජයක්.



| | |
|---|---|
| පරි. අංක | |
| වර්ග අංකය | |
| දිනය | |

# 1. අපේ නව මග

අඩසියවස ඉක්මවූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය දුෂ්කරවූත්, ජයග්‍රාහිවූත් ගමන් මගේ ඓතිහාසික හා තීරණාත්මක සන්ධිස්ථානයකට දැන් එළඹ සිටී. පක්ෂය පිහිටුවා ගෙවීගිය පණස් දෙවසරක කාලය තුළදී අප පක්ෂය වසර 23 ක් ආණ්ඩු බලයේ සිටි අතර, ඉතිරි වසර 29 විපක්ෂයේ සිට ජනතාවට නායකත්වය දී ඇත. 14 වන ජාතික මහා සමුළුව පැවැත්වෙන්නේ නැවත වරක් ආණ්ඩු බලය ලබාගැනීම සඳහා පක්ෂය සිය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අලුතින් සකස්කර ගෙන ඇති අවස්ථාවකයි. එදා - මෙදාතුර පක්ෂයේ ප්‍රතිපත්ති විකාශය වූ ආකාරය දෙස ආපසු හැරී බැලීමෙන් නව වැඩ පිළිවෙල වඩාත් නිවැරදිව අවබෝධ කරගත හැකිය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිවූයේ ඊට කලින් පැවති සිංහල මහා සභාවේ පරිනාමයක් හා වඩාත් ප්‍රබුද්ධ වූ ඉදිරි පරිවර්තනයක් හැටියටය. 1934 මැයි 19 වනදා සිංහල මහා සභාවේ මංගල රැස්වීම අමතමින් එහි නිර්මාතෘ දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා පෙන්වා දුන් පරිදි, එම පක්ෂය බිහිවූයේ එදා පැවති ජාතික අවශ්‍යතාවක් සපුරාලීමටය. අධිරාජ්‍යවාදී යුගයේදී අප මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ ජාතික නිදහස යළි දිනා ගැනීමයි. මෙහිදී මුළුමහත් ජාතිය එක්සත් කිරීමේ අවසාන අරමුණ මුදුන් පමුණුවා ගැනීම මතුවට තබා රටේ ප්‍රධාන ජාතිය වූ සිංහල ජනතාව එක්සත් කිරීම පළමු අත්‍යාවශ්‍ය කටයුත්ත යැයි බණ්ඩාරනායක මහතා කල්පනා කළේය. ලොවපුරා අධිරාජ්‍යවාදී පාලන පැතිර පැවති වකවානුවක විදේශීය ආධිපත්‍යයට විරුද්ධව ජනතාව මෙහෙයවීම සඳහා පළමුව ජාතිකත්වය හා දේශප්‍රේමීත්වය වර්ධනය කළයුතු විය.

1948 දී අප රටට නිදහස ලැබුණු නමුදු එමගින් රටේ ජාතික විප්ලවය ජයග්‍රහණය කළේ නැත. එහි තේරුම නම් ජාතියේ පොදු අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිවූ බවය. බණ්ඩාරනායක මහතා අපේක්ෂා කළ එම ශ්‍රේෂ්ඨ කාර්යය එතුමා නායකත්වය දුන් සිංහල මහා සභාව තුළින් ද මුදුන්පත්වූයේ නැත. නිදහස ලැබීමත් සමග සිදුවූයේ එතුවක් කලක් අධිරාජ්‍යවාදීන් සතුව තිබූ දේශපාලන බලය අධිරාජ්‍ය ගැති සහ ඔවුන්ගේ සිරිත් විරිත් අන්ධානුකරණයෙන් අනුගමනය කළ කළු සුද්දන් අතට, එනම් විදේශිකයින්ට කත් අදින කොම්ප්‍රදෝරු ධනපති පන්තිය අතට මාරුවීමයි. එදා එක්සත් ජාතික පක්ෂය තුළින්

*යායුතු බවය. <u>අපේ ජාතික භාෂා ව්‍යවහාර</u> කිරීමත් අපේ ජනතාවගේ ජීවිතයට අදාල ජීවමාන බලයක් වනු ඇති තැනට ආගම පුනරුත්ථාපනයට පත්කොට අධ්‍යාත්මික හැඟීම්වලට පුනර්ජීවය දී තහවුරු කිරීමත් මේ සඳහා අවශ්‍ය යැයි මේ පක්ෂය බලාපොරොත්තු වන්නීය.*

*“ හැකිතාක් පොදුජන සහයෝගය උඩ රඳා පවත්නා ආණ්ඩුවෙකින් <u>වැසියන් ගේ කැමැත්තට අනුකූල වූ සමාජවාදී මහජනතාවක්</u> බිහි කිරීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරමාර්ථය වේ.”*

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙම ප්‍රතිපත්ති මාලාව තුළින් එදා දේශීය වශයෙන් පැවති ජාතික අවශ්‍යතාවත් ජාත්‍යන්තර වශයෙන් පැවති සමාජ ආර්ථික පසුතලයත් මොනවට පිළිඹිබු වේ. තවමත් විසඳී නැති රටේ පවතින බොහෝ ප්‍රශ්න දෙස බැලීමේදී වසර පණස් දෙකකට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්මත කරගත් ප්‍රතිපත්ති අදටත් අඩුවැඩි වශයෙන් ගැලපෙන ආකාරය පැහැදිලි ය. එදා ජාත්‍යන්තර වශයෙන් පැවතියේ සමාජවාදී ආර්ථික ක්‍රමයට වඩාත් බරවූ ලෝකයකි. සමාජවාදී පක්ෂවලට අමතරව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂද බොහෝ රටවල බිහිවී තිබුණි. මෙම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල මූලික ප්‍රතිපත්තිය වන්නේ වැඩිපුර රාජ්‍ය සහභාගිත්වය හා මෙහෙයවීම් තුළින් සමාජ සාධාරණත්වය සහතික කිරීමයි. ප්‍රතිපත්ති වශයෙන් ගත්විට ලෝකයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා දක්ෂිණාංශික කොන්සර්වේටිව් පක්ෂ අතර පැහැදිලි බෙදීමක් දැකිය හැකිය.

සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයේ රාජ්‍ය සහභාගිත්වය ආරක්ෂා කිරීම, සමාජය කෙරෙහි රාජ්‍ය වගකීම පවත්වාගෙන යැම, පෞද්ගලික ආධිපත්‍යය වෙනුවට පොදු සමාජ ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, සැමට රැකියා සැපයීම, උපතේ සිට මරණය දක්වා රටවැසියා ආරක්ෂා කිරීම ආදි ප්‍රතිපත්තිවලින් සමන්විත පූර්ණ සුභසාධක රාජ්‍යයකට සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු කැපවී සිටිති.

දක්ෂිණාංශික කොන්සර්වේටිව් පක්ෂවල ප්‍රතිපත්තිය වන්නේ ආර්ථිකය කෙරෙහි ආණ්ඩුවේ බලපෑම හැකිතාක් අඩු කිරීමයි. සිවිල් සමාජය කෙරෙහි බලපෑමක් නොකළයුතු බව ඔවුන්ගේ මතයයි. පෞද්ගලික අංශය කෙරෙහි පූර්ණ විශ්වාසය තබන දක්ෂිණාංශික පක්ෂ වෙළඳපොළ මූලධර්ම අනුව ආර්ථිකය පාලනය කළයුතු යැයි තරයේ විශ්වාස කරයි. බලවතා හා ශක්තිවන්තයා පමණක් ජයග්‍රහණය කිරීමේ මතවාදය නිවැරදි යැයි කියාපාන " කැළෑ නීතිය" ඔව්හු අනුමත කරති. සමාජයේ පවතින අසමානතාව තුරන් කිරීම කෙරෙහි

සැලකිල්ලක් නොදක්වන දක්ෂිණාංශික දේශපාලන පක්ෂ මෙම අසමානතාව පැවතිය යුතු දෙයක් ලෙස පිළිගනී. ජාතිකත්වය හා ඇතැම්විට එය ඉක්මවා ගිය උග්‍ර ජාතිවාදය හා වර්ගවාදය ද දක්ෂිණාංශික පක්ෂවල ප්‍රතිපත්තියකි.

ඉහතින් උපුටා දැක්වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් ඡේදයෙන් පැහැදිළි වන්නේ එම පක්ෂය ලෝකයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් අනුගමනය කළ සමාජවාදි ප්‍රතිපත්ති පිළිගත් බවයි. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන නම යෝජනා වන්නට කලින් බණ්ඩාරනායක මහතා සිතා සිටියේ තම නව පක්ෂයට සමාජ ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂය යන නම තැබීමටය.

1956 සිට 1965 දක්වා ද, නැවත 1970 සිට 1977 දක්වා ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනුගමනය කලේ සමාජවාදි ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිපත්ති මාලාවකි. එම ප්‍රතිපත්තිවල මුල්තැන හිමිවී තිබුණේ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ අවශ්‍යතාවටයි. එය කළ හැක්කේ රාජ්‍ය අංශය ශක්තිමත් කිරීමෙන් යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එම පක්ෂය සමග හවුල්වී ආණ්ඩු පිහිටවූ වාමාංශික පක්ෂ විශ්වාස කළේය. 56 පෙරළියත් සමග අපේ ජාතික නිදහස වඩාත් ශක්තිමත් වූ අතර ආර්ථිකයේ රාජ්‍ය අංශය වර්ධනය වන්නට විය. සංස්කෘතික, සාහිත්‍ය හා කලා අංශයේ පෝෂණයක් ද ඇතිවිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 45 වැනි මහා ජාතික සම්මේලනය වෙනුවෙන් තිකුත් කෙරුණු " පන්සාලිස් වසරක පියසටහන් " නමැති සමරු ග්‍රන්ථයට " ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඓතිහාසික යුග මෙහෙවර එදා සහ අද " යන මැයෙන් ලිපියක් සපයමින් ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මෙසේ සඳහන් කළාය.

> *" එදා ඇතිවූ මේ ජාතික විප්ලවය අංග සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ගණනාවක් විය. එයින් ප්‍රධාන ම කාර්යය වූයේ වසර 450 ක් තිස්සේ ලාංකික ජනතාව පාගාගෙන තිබුණු යටත් විජිත සංස්කෘතියෙන් සහ ජීවන රටාවෙන් රට සහ ජනතාව මුදා ගැනීමයි. ඒ සඳහා ශ්‍රී ලාංකික ජාතික අනන්‍යතාව නැවත ගොඩනහා තහවුරු කරන්නට අවශ්‍ය විය. ලෝක ඉතිහාසයේ විවිධ අවස්ථාවන්හි පෙන්නුම් කැර තිබෙන අයුරු මේ සඳහා උපයෝගි කරගත හැකි ප්‍රධාන ප්‍රවාහය වන්නේ රටේ ජනතාවගේ භාෂාවයි. එවකට ලංකාවේ මුළු ජනතාවගෙන් සියයට 85 කට අධික බහුතරය පාවිච්චි කළ සිංහල භාෂාව නැවත ශක්තිමත් කොට ඊට ප්‍රධාන තැන*

ලබාදීම තුලින් යටත් විජිත ආධිපත්‍යය අවසන් කිරීම යුගයේ අනිවාර්ය අවශ්‍යතාව වී තිබුණි.

" ඒ අනුව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කෙරුණි. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම ජාතික විප්ලවය අංග සම්පූර්ණ කිරීම සඳහා කළයුතුව තිබූ ප්‍රගතිශීලී ජාතික කර්තව්‍යයක් මිස අන් භාෂා වලට හානියක් සිදු කිරීමෙක් නොවිය. එය ඇතමුන් අර්ථ නිරූපනය කිරීමට උත්සාහ දරන අන්දමේ ජාතිවාදී ක්‍රියාමාර්ගයක් නොවේ. සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර ම සුළු ජන කොටස්වල අයිතිවාසිකම් සුරැකීමට ද එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණු රජය අමතක නොකළේ ය. දෙමළ භාෂාවට සාධාරණ තැන ලබාදීමේ පනතත් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුමත් ඒ සමගම එළිදුටුවේ මේ සුළු ජන කොටස්වල අයිතින් සුරැකීම සඳහා ය . "

කුමාරතුංග මැතිනියගේ මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිසි විටෙකත් ජාතිවාදී නොවූ බවයි. ජතික විප්ලවයේ මුල් පියවරක් වශයෙන් සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ලබාදෙන අතර දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ලබාදීමට ද එම පක්ෂය නිරතුරුවම කටයුතු කළේය.

බණ්ඩාරනායක මහතාගේ අභාවයෙන් පසුව බලයට පත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන යුගයේදි ජාතික විප්ලවය අංග සම්පූර්ණ කිරීම සඳහා නව නවත් පියවර ගනු ලැබීය. 60 දශකය ශ්‍රී ලංකාවේ පමණක් නොව තුන්වන ලෝකයේ අලුතෙන් නිදහස ලැබූ බොහෝ රටවලද ජාතික නිදහස අංග සම්පූර්ණ කිරීම සඳහා පියවර ගනු ලැබූ වකවානුවක් විය. සමාජවාදී කඳවුර ශක්තිමත්ව පැවති අතර ආර්ථිකයේ රාජ්‍ය අංශය ශක්තිමත් කළයුතුය යන මතය වර්ධනය වෙමින් තිබුණි.

1960 - 65 පාලන කාලය තුළදී රාජ්‍ය සංස්ථා ගණනාවක් බිහිවිය. මේ යුගයේදි ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ ඉස්මතුව තිබූ ප්‍රවණතාවක් නම් ධනවාදය මඟහැර සමාජවාදයට යාහැකි බවය. රාජ්‍ය අංශය වඩ වඩාත් ශක්තිමත් කරමින් බණ්ඩාරනායක මැතිනිය විසින් ගනු ලැබුවේ එම ක්‍රියාමාර්ග යයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණ රට පාලනය කළ 1970 - 1977 යුගයේදි වඩාත් සමාජවාදී පියවර ගනු ලැබීය. 60 දශකයේ මුල් භාගය

මෙන්ම 70 දශකයේ මුල් භාගය ද අන්තර් ජාතික වශයෙන් ප්‍රගතිශීලී බලවේග ශක්තිමත් වූ වකවානුවක් විය. අධිරාජ්‍යවාදී බලපෑම් වඩ වඩාත් දුර්වල වෙමින් තිබුණු අතර නොබැඳි ව්‍යාපරය හා තුන්වන ලෝකයේ ශක්තිය වර්ධනය වෙමින් තිබුණි. මේ ප්‍රබුද්ධ ජාත්‍යන්තර බලපෑමෙන් උපරිම ප්‍රයෝජන ගැනිමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණ අමතක කළේ නැත. අපේ රටේ ස්වාධීනත්වය ශක්තිමත් කළ 1972 ජනරජ ව්‍යවස්ථාව, රත්පවුම් වතු ජනසතුව, පෞද්ගලික ඉඩම් හා නිවාස අයිතිය සීමාකිරීම වැනි ශ්‍රී ලංකා ඉතිහාසයේ පෙර නොවූවිරූ පියවර රැසක් ක්‍රියාත්මක කෙරුණේ මේ කාල වකවානුව තුළදිය.

1994 දි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නායකත්වයෙන් පොදුජන එක්සත් පෙරමුණ බලයට පත්වන විට 1977- 94 වකවානුව තුළදි රට තුළ ඇතිකර තිබූ විනාශකාරී තත්ත්වයෙන් ජනතාව මුදවා ගැනිමට එම ආණ්ඩුවට සිදුවිය. යුද්ධය අවසන් කොට සාමය උදාකිරීම, ණිපණය තුරන් කිරීම, රාජ්‍ය ත්‍රස්තවාදය පිටුදැකිම, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රය යළි ස්ථාපිත කිරීම ආදි කර්තව්‍යයන් රැසක් පැවරුණේ 1994 බලයට පත් පොදුජන එක්සත් පෙරමුණු රජයටය.

1994 අගෝස්තු මාසයේ සිට 2001 දෙසැම්බර් දක්වා කාල පරිච්ජේදය තුළදි මේ රටේ ඉන්පෙර නොවූ විරූ සමාජ පරිවර්තනයකට පදනම දැමුණි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්වර්ණ ජයන්තිය සැමරූ 2001 සැප්තැම්බර් මාසය වනවිට 21 වන සියවස හා නව සහශ්‍රයට ශ්‍රී ලංකාව රැගෙනයාම සඳහා සමත් වන අයුරින් අපගේ පක්ෂය හා දේශය වඩාත් ශක්තිමත්ව ගොඩනැගීමේ අභියෝගයට අපි මුහුණදි සිටියෙමු.. ඉහතකී සියලු අභියෝගවලට මුහුණදෙන අතර ස්ථිරසාර ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයක් තුළ දිළිඳුබව පිටුදැකිම තුළින් අපේ රට තුන්වන ලෝකයේ සංවර්ධිත රටක් බවට පත් කිරීම අපේ අධිෂ්ඨානය විය. මේ සියලු ඉලක්ක එකිනෙකට බැඳි පැවතුනි. ජනතාවාදි ලෙන්ගතු පාලනයක් බිහි කිරීම අපේ අරමුණ විය. අධ්‍යාපන හා සෞඛ්‍යය සේවා ප්‍රතිසංස්කරණ, මනා යටිතල පහසුකම්, විදේශ ආයෝජන, ක්‍රමවත් පෞද්ගලිකකරණය සහ ජනතා හිතවාදි වෙළඳපොළ ආර්ථිකය මගින් ආර්ථික සෞභාග්‍යය උදාකර ගැනිම අපේ තේමාව විය.

මෙම ප්‍රතිපත්ති සකස්කර ගැනිමේදි ඒ වනවිට ජාත්‍යන්තර වශයෙන් පැවති දේශපාලන වටපිටාව ද අපට බලපෑ බව වසන් කළ නොහැකිය. 90 දශකයේ මුල් භාගයේදි සමාජවාදි කඳවුර බිඳවැටුණි. එක් සුපිරි බලවතෙකු පමණක් ඉතිරිවූ අතර දේශපාලන වශයෙන් ඒක ධ්‍රැවීය ලෝකයක් නිර්මාණය විය.

ධනවාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයේ ස්වර්ණමය යුගය ලෙස එම වකවානුව හැඳින්වීමට හැකිවූයේ නැගෙනහිර යුරෝපයේ හා ලතින් ඇමෙරිකාවේ රටවල් නිදහස් ආර්ථික රටාව තුළ විශාල ජයග්‍රහණ ලබාගනිමින් ඉදිරියට යමින් සිටි නිසාය. මේනිසා නිදහස් වෙළඳාම, පෞද්ගලිකකරණය ලිහිල් කරණය සහ විදේශ ආයෝජන පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය ආයතන මගින් දෙනු ලැබූ ආර්ථික උපදෙස් ප්‍රතිපත්ති සම්පාදනයේදී බැහැරකළ නොහැකි තත්ත්වයක් ඇතිවී තිබුණි. මෙහිලා බලපෑවේ එක් අතකින් නිදහස් වෙළඳපොළ ආර්ථිකය සාර්ථක ක්‍රමයක්ය යන විශ්වාසය තහවුරුවීමත්, අනෙක් අතින් ඒවනවිට පැවති ලෝක දේශපාලන පරිසරය සැලකිල්ලට ගනිමින් එම ආයතනවලින් එල්ලවූ දැඩි බලපෑමත්ය.

ධනවාදයේ උච්චතම අවස්ථාව වූ නිදහස් වෙළඳ පොළ ආර්ථික ක්‍රමය බිහිවූයේ බටහිර යුරෝපයේ හා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති සමාජ සංස්කෘතික රටාවට ගැලපෙන ආකාරයටය. එහෙත් ශ්‍රී ලංකාවේ පැවතියේ ඊට හාත්පසින්ම වෙනස් වූ සමාජ සංස්කෘතියකි. අපටම ආවේණිකවූත්, ප්‍රෞඩවූත්, බෙහෙවින් දියුණුවූත් සමාජ ආර්ථික රටාවක් අපට උරුමවී තිබුණි. විවෘත ආර්ථිකය බලහත්කාරයෙන් පැටවීම අපේ සමාජ රටාව අමු අමුවේ දූෂණය කළාවූ අපට නොගැලපෙන ක්‍රියාමාර්ගයක් විය. අද දියුණුයැයි සම්මත බටහිර රටවල් විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව අත්පත් කරගෙන ඇත්තේ වසර 450 ක් මුළුල්ලේ අප වැනි රටවල පවත්වාගෙන ගිය යටත් විජිත පාලනයට ආවේනිකවූ සූරාකෑමේ ප්‍රතිඵල හැටියට ය. එබැවින් අද අප කළයුත්තේ වර්තමාන විද්‍යාත්මක හා තාක්ෂණික ජයග්‍රහණයන්ට පදනම් වූනු විවෘත ආර්ථිකයේ අපට ගැලපෙන අංග ලක්ෂණ පමණක් තෝරා බේරාගෙන ඒවා අපටම ආවේණිකවූ දේශීය ආර්ථික ක්‍රමෝපායන් සමඟ බද්ධ කර ගැනීමයි. ගෝලීයකරණයේ හා නිදහස් වෙළඳපොළ ආර්ථිකයේ ප්‍රබුද්ධ බලපෑම් කාර්යක්ෂම ආර්ථික කළමනාකරණයක් සඳහා යොදා ගතයුතු ආකාරය පිළිබඳව අපට එදා මෙන්ම අදත් ඇත්තේ තුලනාත්මක වැටහීමකි.

මෙම ධනවාදී ආර්ථික න්‍යායන් පිළිබඳව මේවනවිට තත්ත්වය බොහෝදුරට වෙනස් වී තිබේ. නිදහස් වෙළඳ පොළ ආර්ථික න්‍යායන් මධ්‍යස්ථ මතධාරී ආර්ථික විද්‍යාඥයින් අතින් පවා දැඩි විවේචනවලට ලක්වන්නට පටන්ගෙන ඇත. මෙම න්‍යායන් තදින්ම ක්‍රියාත්මක කෙරුණු ලතින් ඇමෙරිකානු රටවල ආර්ථිකය මුළුමණින්ම කඩාවැටී ඇත. රාජ්‍ය අංශය දියකර හැරීම, අසීමිත මූල්‍ය ලිහිල්කරණය, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ණය ලබාගැනීම,

පෞද්ගලිකකරණය සහ දේශීය කර්මාන්ත විනාශ මුඛයට පාත්‍ර කිරීම ආදි ක්‍රියාමාර්ග නිසා අද මේ රටවල් අතිශයින් දුෂ්කර ප්‍රපාතයකට ඇද වැටී ඇත.

එදා නිදහස් වෙළඳපොල ආර්ථිකයේ වැදගත්කම වර්ණනා කළාවුද, එවැනි ආර්ථිකයකින් තොරව තුන්වන ලෝකයට ප්‍රශ්න විසඳාගත නොහැකි යැයි දේශනා කළාවුද, ලෝක බැංකුවේම ජ්‍යෙෂ්ඨ ආර්ථික විශේෂඥයින්ට පවා අද තමන් එදා දැරූ ආර්ථික මතවාද පිළිබඳ පාපෝච්චාරණවල යෙදෙන්නට සිදුවී තිබේ. කවදත් ජාත්‍යන්තර ප්‍රවණතා සැළකිල්ලට ගනිමින් තම දේශීය අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපත්ති සකස්කර ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෝලීයකරණයේ හා නිදහස් වෙළඳපොල ආර්ථිකයේ මෙම අහිතකර බලපෑම සම්බන්ධයෙන් අද සිදු කෙරෙන ඇගයීම් පිළිබඳව දැඩි විමසිල්ලෙන් හා සෝදිසියෙන් සිටී.

අවාසනාවන්ත තත්ත්වය නම් මෙම න්‍යායධර්ම මුලින් හඳුන්වාදුන් හා ඒවා හිස් මුදුනින් ක්‍රියාත්මක කළ ධනේශ්වර රටවල් පවා අද එම ප්‍රතිපත්තිවලින් කිසියම් දුරකට හෝ බැහැරවීමට උත්සාහ දරද්දී අපේ රටේ එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව එම ප්‍රතිපත්ති අන්ධානුකරණයෙන් වැළඳගෙන සිටීමයි. " යළි පුබුදමු ශ්‍රී ලංකා " නමැති ඔවුන්ගේ ආර්ථික වැඩ පිළිවෙල ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියම කරන චට්ටෝරුවල කාබන් කොපියකි. රාජ්‍ය දේපොල දොරදත් දෙන, ජනතා සුභසාධනය නොසළකා බැහැරකර ඇති එම ආර්ථික වැඩ පිළිවෙල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කිසිසේත් පිළිගත නොහැකිය. අප පක්ෂයේ හා එක්සත් ජාතික පෙරමුණේ ආර්ථික ප්‍රතිපත්ති අතර වෙනසක් නැතැයි ඇතැමුන් ඉදිරිපත් කරන තර්ක පදනම් විරහිත ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මුලසිටම සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පිළිගත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයකි. ගෙවුණු වසර 52 ක කාලය තුළදී අප පක්ෂය එම ප්‍රතිපත්තිවලින් බැහැරවී නැත. සමාජ සාධාරණත්වය, සමාන ලෙස සම්පත් බෙදීයාම, ඇති නැති පරතරය අඩු කිරීම, නිදහස, ප්‍රජාතන්ත්‍රය සහ මානව හිමිකම් සුරැකීම යන ප්‍රතිපත්තිවලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අදත් කැපවී සිටී.

මේ අනුව, අද අපේ න්‍යාය පත්‍රයේ පළමු අංකය වන්නේ රටේ සිංහල, දෙමළ හා මුස්ලිම් ආදී සියලු වැසියන්ගේ සමාන අයිතිවාසිකම් සහතික කෙරෙන පරිදි ප්‍රජාතන්ත්‍රය යළි ස්ථාපිත කිරීමයි. එම ප්‍රජාතන්ත්‍රවාදී පදනම මත ජාතික ගැටළුවට සාකච්ඡාමය දේශපාලන විසඳුමක් සොයා ගැනීමයි. දෙවැන්න,

සමාජ සාධාරණත්වය සහ ජනතාවගේ සුභසාධනය පෙරටු කරගත් නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදි ආර්ථික ක්‍රමයක් මගින් ආර්ථික සංවර්ධනයේ වරප්‍රසාද සැම ජන කොටසකටම සාධාරණව බෙදියන පරිදි ආර්ථික සමෘද්ධිය උදාකර ගැනීමයි. දියුණු අධ්‍යාපන හා සෞඛ්‍යය ක්‍රමයක් බිහිකිරීම තුළින් සැමට වරප්‍රසාද ලැබෙන, මානව දයාව පෙරදැරි කරගත් සමාජ සුභසාධන කටයුතුවලට මූල්තැන දෙන ජනතාවාදී ලෙත්ගතු පාලනයක් බිහි කිරීම අපේ න්‍යාය පත්‍රයේ තුන්වන ඉලක්ක යයි. වගකීම් සහගත විවෘත භාවයට මූල්තැන දෙන ප්‍රශස්ත පාලනය සහ රටතුළ මනා ලෙස නීතිය හා සාමය සුරුකීම අපේ සෙසු ප්‍රධාන පරමාර්ථ වන්නේය: මෙම පරමාර්ථ මුදුන්පමුණුවා ගනු සඳහා අප පක්ෂය සකස්කර ඇති නව මාවතේ ප්‍රතිපත්ති මාලාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් ඉදිරි පරිච්ජේදවලින් අපි ඔබට ඉදිරිපත් කරමු.

************

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 2. සමානාත්මතාව තුළින් ජාතික ගැටළුවට විසඳුම්

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 14 වන ජාතික මහා සම්මේලනය පැවැත්වෙන්නේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීම සඳහා යයි කියමින් එක්සත් ජාතික පෙරමුණ ආරම්භ කර ඇති ඊනියා සාම ක්‍රියාදාමය හේතු කොටගෙන අපේ මාතෘ භූමියේ අඛණ්ඩතාවත්, ජනතාවගේ ආරක්ෂාවත් බරපතල අනතුරකට මුහුණ දී ඇති මොහොතකයි. මෙම ජාතික උවදුරෙන් රට ගලවා ගැනීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරිපත් කරන විසඳුම හා ක්‍රියාමාර්ගය ජනතාව හමුවේ නැවත වරක් පැහැදිළි කිරීමට මෙම ඓතිහාසික සමුළුව අතිශය කාලෝචිත අවස්ථාවකි.

එක්සත් ජාතික පක්ෂයට මෙන් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජාතික ගැටළුව සම්බන්ධයෙන් සිය ඉතිහාසය පුරාම පැහැදිළිවූත් ප්‍රබුද්ධවූත් පිළිවෙතක් තිබුණි. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අප පක්ෂය මුලාරම්භයේ සිටම දැරුවේ ජාතිවාදී නොවූ ස්ථාවරයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පූර්වගාමී සංවිධානය වූ සිංහල මහා සභාව පවා 1951 තරම් ඈත කාලයකදී සිංහල හා දෙමළ යන ජාතික භාෂා රාජ්‍ය භාෂා කළයුතු යයි ඉල්ලා සිටියේය.

1951 ජූලි 09 දා මාදම්පේ පැවති සිංහල මහා සභාවේ සංවත්සර සභාවට ඉදිරිපත් කෙරුණු යෝජනාවෙන් මේ බව පැහැදිළි වේ. සිංහල භාෂාව රජයේ භාෂාව යයි වහාම ප්‍රකාශයට පත් කළයුතු බවත්, දෙමළ භාෂාවද රජයේ භාෂාවක් කළයුතු යයි එම භාෂාව කථා කරන ලාංකිකයින්ගෙන් තදබල ඉල්ලීමක් තිබේ නම්, එම භාෂාවද රජයේ භාෂාවක් කිරීම ගැන සභාවේ විරෝධයක් නැති බවත් එහිදී ප්‍රකාශ විය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මුල්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ජාතික භාෂා ගැන මෙසේ සඳහන් වේ.

ජාතික භාෂා

" සිංහල භාෂාව හා ද්‍රවිඩ භාෂාව අප්‍රමාදව රජයේ භාෂාවක් බවට පත්වීම අත්‍යවශ්‍යය. සිංහල හා දෙමළ පමණක් උගත් අයට අද රජයේ තනතුරු ඇරිය

නොහැකිය. ඔවුන්ගේ දැනීමේ, බුද්ධි මහිමයේ ප්‍රයෝජන හා සේවය මුළු ජන සමාජයටම ලබාගැනීමට තම් ඉහතින් දැක් වූ කණගාටුදායක තත්ත්වයෙන් ඔවුන් මුදාලිය යුතුය. එබැවින් වහාම සිංහල හා දෙමළ රජයේ භාෂාවන් කළ යුතුය. රාජ්‍ය පාලනය ද සිංහල හා ද්‍රවිඩ භාෂාවන්ගෙන් කළ යුතුයි. සිංහල ද්‍රවිඩ යන භාෂාවන් සියලුම පාඨශාලාවල ඉගැන්විය යුතුයි ”

56 පෙරළියෙන් පසු සිංහලය රාජ්‍ය භාෂාව කළේද, ඉන්පසුව දෙමළ භාෂාවට සාධාරණ තැන ලබාදෙන පනතක් සම්මත කළේ ද, ඉන් අනතුරුව බණ්ඩාරනායක - චෙල්වනායගම් පනත මගින් බලතල බෙදෙන යෝජනා ඉදිරිපත් කරනු ලැබුවේද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජාතිවාදී නොවූ නිසාය. ජාතික ප්‍රශ්නය, එදා හැඳින්වූ පරිදි “ භාෂා ප්‍රශ්නය ” සම්බන්ධයෙන් එවන් ප්‍රගතිශීලී පිළිවෙතක් අනුගමනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පොදුජන එක්සත් පෙරමුණ වශයෙන් බලයට පත්වීමෙන් පසු ජාතික ගැටළුව සම්බන්ධයෙන් ඉතාමත් ප්‍රබුද්ධ වූත්, නිර්භීත වූත් දේශපාලන පිළිවෙතක් ක්‍රියාවට නැංවීම ආරම්භ කළේ ය. දකුණේ ජාතිවාදී උද්ඝෝෂණවලින් තම දේශපාලන අනාගතයට තර්ජනයක් එල්ලවිය හැකි යැයි ඇතැම් කොටස් පක්ෂයට අනතුරු අඟවා තිබුණ ද නිවැරදි ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට අප බිය වූයේ නැත.

1994 අගෝස්තු මස බලයට පැමිණ, දින ස්වල්පයක් ගත වෙද්දී එල්ටීටීඊ ය සමග සාකච්ඡා ආරම්භ කිරීමට කටයුතු කළ ශ්‍රී.ලං.නි.ප. ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණ 1995 ජනවාරි මාසයේ දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමකට ද එළඹියේ ය. එහෙත් එම වසරේම අප්‍රේල් මාසය වනවිට එල්ටීටීඊය සාමයට දිගුකළ අත සපා කෑ විට, යළිත් අකමැත්තෙන් හෝ යුද්ධමය ක්‍රියා මාර්ගයක් ගැනීමට පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව සිදු වූවත්, දේශපාලන විසඳුමක් පිළිබඳ ප්‍රතිපත්තිය කිසිවිටකත් අත්හැර දැමුවේ නැත. 1995 අගෝස්තු මාසයේදී මේ සඳහා දේශපාලන යෝජනා මාලාවක් ඉදිරිපත් කළ පොදුජන එක්සත් පෙරමුණ 1997 දින්, ඒ පිළිබඳ ව්‍යවස්ථා කෙටුම්පතක් ද ඉදිරිපත් කළේය. ඉන්පසු මාස ගණනාවක් මුළුල්ලේ මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවේදී සාකච්ඡාවට යොමුවිය. නව ව්‍යවස්ථාව සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය වන අතිරේක ඡන්ද 16 ලබා දෙන්නැයි පොදුජන එක්සත් පෙරමුණ එක්සත් ජාතික පක්ෂයට කොතරම් කන්නලව් කළද එම සහයෝගය ලැබුණේ නැත. ජනාධිපතිවරණය මාස 15 කට

කලින් 1999 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට ජනාධිපතිනිය තීරණය කලේ ද මෙම ව්‍යවස්ථාව සම්මත කරගැනීම සඳහා අවශ්‍ය ජනවරම ලබා ගැනීමටය.

මෙසේ තම මුළු පාලන කාලය පුරාම සැබෑ සාමය වෙනුවෙන් හඩ නැගූ අප නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව එකඟත්වයක් ඇතිකර ගැනීම සඳහා 2000 දී එ.ජා.ප. ඇතුළු සියළු දේශපාලන පක්ෂ සමග මාස 5 ක කාලයක් පුරා සාකච්ඡා පැවැත්විය. එම සාකච්ඡාවේදී එ.ජා.ප.යේ ඉල්ලීම පරිදි 1997 ව්‍යවස්ථා කෙටුම්පත තවදුරටත් සංශෝධනයට ලක්කිරීමට සිදුවිය. මෙම ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට සහාය දෙන බවට එ.ජා.ප. එදා පොරොන්දු වූ බැවින්, 2000 අගෝස්තු මාසයේ දී එම කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුනි. එහෙත් ඒ අවස්ථාවේදී එ.ජා.ප. ක්‍රියාකළ දේශද්‍රෝහි, තිහිත ආකාරය අමුතුවෙන් සිහිපත් කළයුතු නොවේ.

වසර 2000 අප්‍රේල්, මැයි වනවිට යුද්ධය උත්සන්න අතට හැරී තිබුණද, සාමය සඳහා දැරූ වෑයම අප කිසිවිටකත් අත්හැරියේ නැත. එක් පැත්තකින් සටන් කරන අතර අනෙක් පැත්තෙන් සාමකාමී විසඳුමක් සඳහා උත්සාහ දැරුනි. 1999 මාර්තු මස සිට නෝර්වේ රාජ්‍ය හරහා එල්ටීටීඊය සමග සම්බන්ධතා ගොඩනැගූ අතර 2001 මාර්තු වනවිට සටන් විරාම ගිවිසුමක් සඳහා අවබෝධතා ගිවිසුමක් පවා සකස් කරගෙන තිබුණි.

එහෙත් ඒ වනවිට එක්සත් ජාතික පෙරමුණ සහ එල්ටීටීඊ ය අතර රහස් ගිවිසුමක් ඇතිවී තිබුණ බැවින් එල්ටීටීඊය අවසාන මොහොතේදී අවබෝධතා ගිවිසුමට පිටුපෑවේය. 2001 දෙසැම්බර් මැතිවරණයට කලින් එල්ටීටීඊය හා එක්සත් ජාතික පෙරමුණ අතර රහස් ගිවිසුමක් පැවති බව අපි ජනතාවට නිරන්තරයෙන් අනතුරු ඇඟවූයෙමු. අප එදා මේ සම්බන්ධයෙන් කළ හෙළිදරව් කිරීම් සත්‍ය බව අද වන විට ඔප්පු වී තිබේ. <u>එල්ටීටීඊ සංවිධානයේ ඉල්ලීම් ලබාදීමට රනිල් වික්‍රමසිංහ මහතා මැතිවරණයට පෙර පොරොන්දු වූ බව ඇන්ටන් බාලසිංහම් හා තමිල් සෙල්වම් යන එල්ටීටීඊ නායකයෝ දැන් ප්‍රකාශ කරති</u>. 2001 දෙසැම්බර් මැතිවරණයෙන් පසු බලයට පත් එක්සත් ජාතික පෙරමුණ එල්ටීටීඊය සමග සාකච්ඡා ආරම්භ කළේ මෙසේ කලින් ඇති කරගෙන තිබූ රහස් ගිවිසුම් පදනම් කරගෙන බව දැන් ඉතා පැහැදිලි ය.

පොදුජන එක්සත් පෙරමුණ විසින් අරඹන ලද සාම ක්‍රියාදාමය තමන් ඉදිරියට ගෙනයන බව එක්සත් ජාතික පෙරමුණ කියා සිටිය ද දර්ශනය, අරමුණු,, දිශාව සහ ක්‍රමෝපායන් ආදියෙන් පෙනී යන්නේ මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස්

පක්ෂය හා එ.ජා.පෙ. අතර කැපී පෙනෙන වෙනස්කම් තිබෙන බවයි. සාම ක්‍රියාදාමය සාර්ථකව ඉදිරියට ගෙනයාම කෙසේ වෙතත්, එල්ටීටීඊය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට ඇදා ගැනීම සඳහා පොදු පෙරමුණ අනුගමනය කළ මූලික අරමුණ පවා මේ වනවිට විනාශ වී ගොස්ය.

එල්ටීටීඊය සාම ක්‍රියාදාමයට එක්කර ගැනීම සඳහා බලපෑ හේතු සාධක බොහෝය. 1995 සිට එල්ටීටීඊය යුද්ධමය වශයෙන් පසුබැස සිටීම සහ ජාත්‍යන්තර වශයෙන් එම සංවිධානය තහනම් කරනු ලැබ තිබීම, බහුතර සිංහල / මුස්ලිම් ජනතාවගේ එල්ටීටීඊ විරෝධය නිසා තිබූ යුධ ආකල්පය වෙනස් කිරීම පිණිස පොදුජන එක්සත් පෙරමුණු රජය විශාල මෙහෙයක් ඉටුකරමින්, 1994 වන විට සිංහල, මුස්ලිම් ජනතාව අතරින් 22 % ක් පමණ දේශපාලන විසඳුමකට එකඟ වූ තත්ත්වය, 58 % දක්වා වර්ධනය කර තිබීම, 2001 සැප්තැම්බර් 11 වැනිදා ඇමෙරිකාවේ ඇතිවූ සිද්ධියෙන් පසු ඇතිවූ ජාත්‍යන්තර ප්‍රවණතාව ආදී කරුණු එහිලා බලපෑවේ ය. එහෙත් තමන්ට වාසිදායක මෙම වාතාවරණයෙන් නිසි පරිදි ප්‍රයෝජන ගැනීමට එක්සත් ජාතික පෙරමුණට හැකිවූයේ නැත. මෙම ඓතිහාසික අවස්ථාව අපතේ හරිමින් එජාප ය කළේ එල්ටීටීඊ සහාය ඇතිව රාජ්‍ය බලය රැක ගැනීමේ දේශපාලන ව්‍යායාමයක යෙදීම බව දැන් ඉතා පැහැදිලි ය. සටන් විරාම ගිවිසුම අත්සන් කළදා සිට සිදුවී ඇති සෑම දෙයකින්ම මෙය මොනවට ඔප්පු වේ. ශ්‍රී.ලං.නි.ප.ය මුල සිටම පෙන්වා දුන් අවබෝධතා ගිවිසුමේ දුර්වලතා අද දිනපතා සත්‍යයක් වෙමින් පවතී.

අවබෝධතා ගිවිසුමෙන් වාසි සැලසී ඇත්තේ එල්ටීටීඊ සංවිධානයටය. ආරක්ෂක අංශවලට තොරතුරු සපයන පුද්ගලයින් ඝාතනය කිරීම්, දේශපාලන විරුද්ධවාදීන් මරා දැමීම, ළමා සෙබළුන් බඳවා ගැනීම, හොර රහසේ අවිගෙන ඒම, අලුතින් සෙබළුන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම, නීති විරෝධී පොලිසි පවත්වාගෙනයාම, බදු හා කප්පම් ගැනීම සහ ඊලාම් අධිකරණ පවත්වාගෙන යාම ආදී සියල්ලක්ම සිදු වන්නේ සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වෙද්දී ය. මේ පසුබිම තුළ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියා සිටී.

ගතවූ වසරකට වැඩි කාලය තුළ සාකච්ඡා ඉදිරියට ගොස් ඇති ආකාරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනුමත කරන්නේ නැත. නිසි රාමුවක් හෝ න්‍යාය පත්‍රයක් අනුව මෙම සාකච්ඡා පවත්වන බවක් නොපෙනේ. විශේෂයෙන් දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට තුඩුදී ඇති මූලික කරුණු සාකච්ඡාවට භාජනය වී නැත.

එල්ටීටීඊය ඉල්ලන සැම දෙයක්ම ලබාදෙනවා විනා, සාකච්ජා මේසයේදී ආණ්ඩුව කේවල් නොකිරීම විශ්මයට කරුණකි.

සාකච්ජා ක්‍රියාදාමය සම්බන්ධයෙන් ඇතිවී තිබෙන අන්තර් ජාතික බලපෑම් කෙරෙහි ද ශ්‍රී.ලං.නි.ප.ය බරපතල ලෙස සැලකිලිමත් වී සිටී. අපගේ ප්‍රශ්නය විසදා ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් කෙරෙන බලපෑම්වල යහපත් පැති මෙන්ම, අයහපත් පැති ද ඇති බව අපි පෙන්වා දෙන්නෙමු. එල්ටීටීඊය සාකච්ජාවට කැඳවාගෙන ඒම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් කෙරෙන බලපෑම් වැදගත් බව පක්ෂය පිළිගන්නා නමුදු, එල්ටීටීඊ සංවිධානයත් ස්වෛරී රාජ්‍යයක් වන ශ්‍රී ලංකා ආණ්ඩුවත් සමාන මට්ටමෙහි ලා සැලකීමට ඇතැම් රටවල් දරණ වෑයම අපි හෙළා දකින්නෙමු. සාකච්ජා සඳහා පහසුකම් සපයන රාජ්‍යයක් ලෙස නෝර්වේ රටට ආරාධනා කළේ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව වුවද අද නෝර්වේ රාජ්‍ය මැදිහත්කරුවෙකුගේ සහ තීරකයෙකුගේ තත්ත්වයට පත්ව සිටීම ශ්‍රී.ලං.නි.ප.ය අනුමත නොකරයි.

ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ සභාවේ කාර්යභාරය, එහි නිරීක්ෂණ හා තීරණ කෙරෙහි ද ශ්‍රී.ලං.නි.ප.යට හැමවිටම එකඟවිය නොහැකිය. මෙම නිරීක්ෂණ සභාවේ සංයුතිය ( COMPOSITION) කාර්යභාරය සහ වගකීම් සමාලෝචනය කොට යළිත් අලුතින් සකස්කළ යුතු යැයි පක්ෂය කල්පනා කරයි.

දකුණු ආසියාවේ ශ්‍රී ලංකාවේ පිහිටීම සැලකිල්ලට ගත්විට අපට බලපාන භූ දේශපාලන තත්ත්වයන් බැහැර කළ නොහැකි ය. එ.ජා.පෙ. අනුගමනය කරන සාම වැඩ පිළිවෙලේ තවත් බරපතල අඩුවක් වන්නේ ශ්‍රී ලංකාවේ භූ දේශපාලන වැදගත්කම සැලකිල්ලට නොගැනීමයි. ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක් වන අතර, එය දකුණු ආසියානු රාජ්‍ය පද්ධතියේ සාමාජික රටකි. එබැවින් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය පිළිබඳ ප්‍රශ්නය දකුණු ආසියානු කලාපයටම බලපාන්නේ ය. මේ පසුබිම තුළ තවමත් ප්‍රචණ්ඩත්වය අත්හැර නැති එල්ටීටීඊය සමග සිය ස්වෛරීභාවය බෙදා ගැනීමට එ.ජා.පෙ. ආණ්ඩුව දරණ වෑයම මුළු දකුණු ආසියාවේම සුරක්ෂිත භාවයට තර්ජනයක් ඇතිවීමට හේතුවක් වනු ඇත.

අපේ ජාතික ගැටළුවට විසඳුම් සෙවීමේදී කාලාන්තරයක් මුළුල්ලේ අපගේ මිත්‍ර රාජ්‍යයක් වශයෙන් පවතින ඉන්දියාවේ ආරක්ෂක මිනැළපාකම් ශ්‍රී.ලං.නි.ප. සැලකිල්ලට ගනී. එහෙත් එක්සත් ජාතික පෙරමුණ මේ අංශය කෙරෙහි

සැලකිල්ලක් දක්වන බවක් නොපෙනේ. සාමකාමී විසඳුමක් සඳහා දරණ වැයමේදී ඉන්දියාව ශක්තියකැයි ශ්‍රී.ලං.නි.ප. විශ්වාස කරයි.

වත්මන් සාම ක්‍රියාදාමයට විකල්පය යුද්ධය බවත්, සැලසුම් කළ පරිදි එය ඉදිරියට ගෙනයාමට ඔවුන්ට බාධා පැමිණියහොත් ශ්‍රී ලංකාව යළි යුද්ධයකට මුහුණ දියයුතු බවත්, එක්සත් ජාතික පෙරමුණේ අදහසයි. එක්සත් ජාතික පෙරමුණේ ව්‍යාජ සාමයේ අවසානය අති භයානක යුද්ධයකින් රට අරාජිකවීම හෝ රට දෙකඩවීම බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතයයි.

මෙසේ බලන කළ එක්සත් ජාතික පෙරමුණේ ව්‍යාජ සාමයට විකල්පය වන්නේ, සැමට සාධාරණය ඉටුවන සාමකාමී රටක් ගොඩනැගීම සඳහා සාකච්ජාමය දේශපාලන වැඩ සටහනකට අවතීර්ණ වනු පිණිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සකස් කර ඇති වැඩ සටහනයි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අද අප ඉදිරියේ ඇති අභියෝග

I පලාත් හා මධ්‍යම ආණ්ඩුව අතර බලය බෙදාගැනීමේ පැහැදිලි වැඩ පිළිවෙලක් සහතික කෙරෙන ව්‍යවස්ථා රාමුවක් සකස් කරනු ඇත.

ii රටේ ජාතික කටයුතු වලට සියලු ජන කොටස්වල පූර්ණ සහභාගිත්වය සහතික කරන අතර, සියලු දෙනාම ප්‍රජාතන්ත්‍රවාදී සාමාජයක කොටස්කරුවන් බවට පත්කර ගනු ලැබේ. ඒ ඒ පලාත්වල කලාපීය ස්වතන්ත්‍රභාවය තහවුරු කරන ප්‍රජාතන්ත්‍රවාදිවූත්, කාර්යක්ෂමවූත්, මධ්‍යම ආණ්ඩුවක් අපි පවත්වාගෙන යන්නෙමු.

iii මේ අනුව වර්තමානයේ එක්සත් ජාතික පෙරමුණ යටතේ සිදුවන්නාක් මෙන් එල්ටීටීඊ සංවිධානයේ සියලුම අසාධාරණ ඉල්ලීම්වලට යටනොවී, එක්සත් රාජ්‍යයක් තුළ ලබාදිය හැකි උපරිම දේශපාලන බලතල මොනවාදැයි එල්ටීටීඊ සංවිධානය සමග සාකච්ජා කිරීමට අපි එකඟ වෙමු.

iv එසේම රටේ ආරක්ෂාවට කිසිම අනතුරක් ඇතිවීමට ඉඩ නොතබා, ආරක්ෂක හමුදා ශක්තිමත් කිරීමේ හා දිරි ගැන්වීමේ වැඩ පිළිවෙලක් සාම ක්‍රියාදාමයට සමගාමීව ඉදිරියට ගෙනයා යුතුය.

v සැමට සාධාරණය ඉටුවන, දෙමළ ජනතාවගේ අභිලාෂයක් ඉටුකරන ව්‍යවස්ථාමය පදනම වශයෙන් 1997 හා 2000 දී රටට ඉදිරිපත් කළ

ව්‍යවස්ථා රාමුව සාකච්ඡා සඳහා පදනමක් ලෙස යොදාගත හැකි යැයි අපි බලාපොරොත්තු වෙමු.

vi අපේක්ෂිත අරාජක තත්ත්වයෙන් මිදීම බේරා ගැනීම.

vii දේශපාලන විසඳුමකින් සැමට සාධාරණය ඉටුවන ස්ථිරසාර සාමයක් උදා කිරීම.

Viii සාම ක්‍රියාදාමයේ පාර්ශවකරුවෙකු ලෙස එල්ටීටීඊ සංවිධානය බහුපාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට සම්බන්ධ කර ගැනීම.

Ix පශ්චාත් ගැටුම් නිරාකරණය සඳහා බහුවාර්ගික සමාජ අවශ්‍යතා ඉටුකරන, සියලු ජන කොටස් හා ඔවුන්ගේ නායකත්වය එකඟවූ ව්‍යවස්ථාමය රාමුවක් සකස් කිරීම.

x උතුරු නැගෙනහිර ජීවත්වන දෙමළ ජනතාව සමාජ, ආර්ථික, අධ්‍යාපනික හා දේශපාලන අයිතීන් සුරකින, රැකියා අවස්ථා ඇති කරන පුළුල් දේශපාලන බලතල ලබාදීම අපගේ ප්‍රතිපත්තියයි.

xi එවන් රාමුවක් තුළ උතුරු නැගෙනහිර ජීවත්වන මුස්ලිම් හා සිංහල ජනතාවගේ අයිතිවාසිකම්ද සුරැකීම අනිවාර්යය වන්නේය. මේ සියලු ජන කොටස්වලට සමානතාවයෙන් හා ආත්ම ගරුත්වයෙන් යුතුව ජීවත්විය හැකි පරිසරයක් අපි නිර්මාණය කරන්නෙමු.

xii තමන්ගේ සංස්කෘතික අනන්‍යතාව රැක ගැනීමටත්, තම තමන්ගේ විශ්වාසය අනුව ආගම් ඇදහීමටත්, ස්වකීය භාෂා පෝෂණය කිරීමටත්, තමන්ගේ ජාතික භාෂාවලින් ආණ්ඩුව සමග ගනුදෙනු කිරීමටත් සියලු ජන කොටස් වලට ඇති අයිතිය අපි ලබා දෙන්නෙමු.

xiii නීතිය ඉදිරියේ සියලු දෙනා සමාන වන අතර තමන්ගේ මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට ජනතාවට ඇති අයිතිය සහතික කරන්නෙමු.

ඉහතින් විස්තර කළ ප්‍රතිපත්ති රාමුව මත පිහිටා, සටන් විරාමය ඉදිරියට ගෙනයමින් , එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමට අපි එකඟ වෙමු.

***************

## 3. දේශීයත්වය සමග බද්ධ වූ නව ආර්ථික සැලැස්ම.

*" අපේ රටේ සාමය හා දේශපාලන ස්ථාවරත්වය යළි ස්ථාපිත කරන්නේ නැතිව තිරසාර ආර්ථික වර්ධනයක් ළගාකර ගත නොහැකිය. මෙම ආර්ථික වර්ධනය ළගාකර ගත හැක්කේ වර්ගය, ආගම හෝ දේශපාලන භේදයෙන් තොරව, ශ්‍රී ලංකාවේ සැම වැසියෙකුටම ආත්ම ගරුත්වයෙන් යුතුව සමාන අවස්ථා භුක්ති විඳිමින් ජීවත් විය හැකි පරිසරයක් තුළ පමණි. "*

(ශ්‍රී ලංකා ජනාධිපතිනිය 2002 ජුනි මාසයේ පැවති ශ්‍රී ලංකා සංවර්ධන සමුළුව අමතමින් )

1994 දී පොදුජන එක්සත් පෙරමුණ පළමුවරට බලයට පත්වූ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය නව සහශ්‍රයට ගැලපෙන පරිදි සකස්කොට ප්‍රකාශයට පත් කළෙමු. 1994 සිට එම දර්ශනය අනුව ක්‍රියාකළ අපට වසර 2001 වනවිට සෑහෙන දුරක් සාර්ථකව ඉදිරියට යාමට හැකි විය. එහෙත් 2002 ජනවාරි මාසයේ සිට රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම වෙනස් මගක් ගෙන තිබේ. එදා පැහැදිලි ඉදිරි ගමනක යෙදුණු අපේ ආර්ථිකය අද විවිධ අතුරුමාර්ගවල අතරමංවී ඇති බවක් පෙනේ. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ රටේ ජනගහනයෙන් 80% කට පමණ බහුවිධ ප්‍රශ්න ගණනාවකට මුහුණදීමට සිදුවීමයි.

අප රට පාලනය කළ වසර හතහමාරක පමණ කාලය තුළදී ආර්ථික කළමනාකරණ ක්ෂේත්‍රයේ අප ලැබූ අත්දැකීම් සහ අප උගත් පාඩම් මෙන්ම ගෙවුණු වසර එකහමාර තුළ රටේ ඇතිවී තිබෙන ආර්ථික අර්බුදය ද අප වටහා ගත යුතුය. ඉදිරි දසවසර සඳහා අප නව ආර්ථික වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්නේ මේ සියලු අත්දැකීම් පදනම් කරගෙනය. ඉදිරි යුගයට අවශ්‍ය පරිදි මනා ලෙස පෙරා පිරිසිදු කළ ආර්ථික වැඩපිළිවෙළක් අපි ඉදිරිපත් කරන්නෙමු.

මෙහිදී අප පදනම් කරගන්නේ අප පක්ෂයේ නිර්මාතෘවරුන් අපට මුල සිටම දායද කරදුන් සමාජවාදී, ප්‍රජාතන්ත්‍රවාදී, දේශපාලන හා ආර්ථික වැඩපිළිවෙළයි. එම වැඩපිලිවෙලේ වඩාත් සුවශේෂත්වය වන්නේ අපටම ආවේනික වූ දේශීය ආර්ථික ක්‍රමෝපායන් සමග නූතන වෙළඳපොල ආර්ථික න්‍යාය ධර්ම අප රටට ගැලපෙන ආකාරයට එහි බද්ධ කොට තිබීමයි.

නිදහස ලබා වසර පනස් පහක කාලයක් ගතවී ඇතත් ආර්ථික දියුණුව අවශ්‍ය පරිදි උදාකරගැනීමට අපට තවමත් හැකිවී නැත. රටේ පැවති දිළිඳුභාවය හා ඌණ සංවර්ධනය එලෙසම පවතී. 1977 පසු මේ රටේ ක්‍රියාත්මකවූ විවෘත ආර්ථිකයෙන් ද අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නැත. විවෘත ආර්ථිකය ක්‍රියාත්මකවූ විසිපස් වසරක කාලය තුළදී අපේ රටේ සමස්ත ආර්ථික වර්ධනය 4 .7% ක් විය. නිදහසින් පසු පැවති වසර දහඅට තුළදී රටේ සාමාන්‍ය ආර්ථික වර්ධනය 3.5% කි. එම 3.5% ආර්ථික වර්ධනය අප ලබාගත්තේ පැරණි සම්ප්‍රදායික ආර්ථකයේ, යටත් විජිත ආර්ථිකයේ සහ රාජ්‍ය ආර්ථිකයේ සියලු ව්‍යුහයන් සම්මිශ්‍රණයක් ඇතිව ක්‍රියාත්මකවූ යුගයේදී ය. විවෘත ආර්ථික ක්‍රමය එතරම් ප්‍රබලවූයේ නම් ගෙවුනු විසිපස් වසර තුළ ලබාගත හැකිවූ ආර්ථික වර්ධනය මීට වඩා බෙහෙවින් වැඩිවිය යුතුව තිබුණි. මෙපමණක් නොවේ, විවෘත ආර්ථිකය නිසා ඇති නැති පරතරය අතිශයින් උග්‍ර අතට හැරුණි. රටේ මුළු ජනගහනයෙන් වැඩිම වරප්‍රසාද ලත් 20% පමණ දෙනා මුළු ජාතික ආදායමින් 54% ක් හිමිකර ගෙන සිටි. මුළු ජනගහනයෙන් අඩුම ආදායම් ලබන 40% ගේ ආදායම සහ ජීවන තත්ත්වයන් ඉකුත් විසිපස් වසර තුළදී කිසිම අයුරකින් වර්ධනයවී නැත. එසේම ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවී ඇතත් ජනතාවට අත්‍යවශ්‍ය වන අංශ සඳහා රජය වැයකළ මුදල් 1977 සිට 1994 කාලය තුළදී ක්‍රමයෙන් අඩුවිය.

විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණික සංවර්ධනය විවෘත ආර්ථිකයේ විශේෂ ලක්ෂණ හා වාසි හැටියට සැමවිටම පෙන්වා දෙනු ලැබේ. එහෙත් ශ්‍රී ලංකාවේ මෙය එන්ට එන්ටම පහත බැස ඇත. ඒ අතරතුර අයවැය පරතරය අඛණ්ඩව ඉහල යමින් පවතී. ජාතික ආදායම අඩුවන අතර, රාජ්‍ය අංශයේ වියදම් දිනපතා වැඩිවෙයි. ආර්ථික වර්ධනයට අත්‍යවශ්‍ය වන ප්‍රාග්ධන වියදම් දිගටම පහල බසී. දළ ජාතික නිෂ්පාදිතය සමග සසඳන විට 1977 දක්වා රජයේ ණය ප්‍රමාණය 67% කි. 1988 වනවිට එය

100% ඉක්ම විය. 1998 දී එය 86% දක්වා අඩුකිරීමට අපි සමත්වුයෙමු. එහෙත් 2000 වනවිට යුධ වියදම් හේතුකොට ගෙන යළිත් මෙය 97% දක්වා ඉහළ ගියේය. එක්සත් ජාතික පෙරමුණේ අවුරුද්දක පාලන කාලය තුළදී මේ ණය බර 105% දක්වා වැඩිවිය. සංවර්ධනය සඳහා රජය වැය කරන මුදල 1980 ගණන්වල දී 15% ක් ව තිබූ අතර, 2002 දී එය 4.6% දක්වා පහළ බැස්සේය. වසර 2000 න් පසු නිදහස් ලංකාවේ සංවර්ධනය සඳහා වාර්ෂිකව වැයකළ අඩුම මුදලයි මේ. මේ අඩුව පිරවීමට විදේශ ආයෝජකයින් හෝ දේශීය පෞද්ගලික අංශය හෝ කටයුතු කර නැත. විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ වැඩියෙන් ලැබී තිබෙන්නේ ප්‍රධාන නගර කිහිපයක් වටා පිහිටි නාගරික මධ්‍යස්ථානවලටයි. ජනගහනයෙන් 29% ජීවත්වන බස්නාහිර පළාතේ දළ දේශීය නිෂ්පාදනය 50% වන අතර, ජනගහනයෙන් 12.% ප්‍රමාණයක් ජීවත්වන වයඹ පළාතේ නිෂ්පාදනය වන්නේ 10% කි. ජනගහනයෙන් 25% ජීවත්වන දකුණු සහ මධ්‍යම පළාත් දෙකේ පොදුවේ නිෂ්පාදනය වන්නේ 18% කි. ජනගහනයේ 35% ප්‍රමාණයක් ජීවත්වන රටේ ඉතිරි පළාත් පහේ නිෂ්පාදනය වන්නේ 22% කි. මෙම අසමතුලිතාව රටේ සමාජ දේශපාලන ස්ථාවරත්වයට බෙහෙවින් අහිතකර ලෙස බලපා ඇත.

මේ කාලය තුළදී දේශපාලනිකරණය හා පලිගන්නා සුළු රජයක ක්‍රියාදාමය හේතුකොට ගෙන රාජ්‍ය සේවයේ කළමනාකරණය විශාල වශයෙන් බිඳ වැටුණි. 1970 - 77 කාලය තුළදී අධ්‍යාපන සහ සෞඛ්‍ය සඳහා වැයකළ මුදල දළ ජාතික වියදමින් 3.2% ක් සහ 1.7% අතර විය. එහෙත් 1977 සිට 1994 දක්වා කාලය තුළදී මෙය 2.7% සහ 1.5% දක්වා අඩුවිය. 1995 න් පසු තවදුරටත් අඩුවීම නතර කිරීමට අපට හැකිවූයේ යුද්ධයට ද මුදල් වියදම් කරන අතරතුරය. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වැය කරන මුදල් 2002 ජනවාරි මාසයේ සිට තවදුරටත් අඩුවන්නට පටන් ගෙන තිබේ. මේ තුළින් මානව සම්පත් සංවර්ධනයට සහ ජනතා සුභසාධනයට ඉතාමත් අහිතකර බලපෑමක් සිදුවී ඇත.

විරැකියාව සම්බන්ධව ද අපේක්ෂිත විසඳුම් ලැබුණේ නැත. විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මකවූ දාහත් වසරක කාලයෙන් පසු 1994 දී අප බලයට පත්වන විට විරැකියාව 14% ක් තරම් ඉහල මට්ටමක පැවතීමෙන් ඒ බව පැහැදිලිය. එහෙත් වසර 2000 අවසන් භාගය වනවිට විරැකියාව 7.5% දක්වා අඩුකිරීමට අපි සමත්වීමු. 2002 වනවිට මෙම සංඛ්‍යාව

නැවත වරක් 9.5% දක්වා වැඩිවී තිබේ. 2003 වසරේදී රැකියා නැත්තවුන්ගේ සංඛ්‍යාව දශලක්ෂය ඉක්මවනු ඇතැයි ගණන් බලා ඇත.

1956 සමාජ ආර්ථික පෙරළියත් සමග නිදහස් වූ ජාතික ආර්ථික බලවේගවලට එතෙක් පැවති යටත්විජිත ආර්ථික රාමුව දෙදරා හැරීමට හැකිවිය. මෙම දේශීය ආර්ථික බලවේගවල සුවිශේෂීවූ පුණරුදයක් අපි එදා දුටුවෙමු. මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යාපාර රැසක් ඉදිරියට ගියේය. පෞද්ගලික අංශය එක් පැත්තකින් එසේ කුඩා ව්‍යාපාර ආරම්භ කරද්දී, මහා පරිමාණ ව්‍යාපාර ආණ්ඩුව විසින් ආරම්භ කරන ලදී.

1977 න් පසු විවෘත ආර්ථික ක්‍රමය අසීමිත ලෙස වර්ධනය වන්නට ඉඩදීමත්, සීමා රහිත ලෙස ආර්ථික ලිහිල්කරණයට ඉඩදීමත් නිසා අප එතෙක් ගොඩනගා ගෙන තිබූ ජාතික ආර්ථික නිෂ්පාදන රටාවට විශාල වශයෙන් හානි සිදුවන්නට විය. බටහිර ලෝකයේ රටවල විවෘත ආර්ථිකය බිහිවී වර්ධනයවීමට සියවස් ගණනාවක් ගතවිය. ඒ කාලය තුළදී තමන්ගේ දේශීය නිෂ්පාදන ඉතාමත් ප්‍රබල ලෙස ආරක්ෂා කරගැනීමට එම රටවලට හැකිවිය. විවිධාකාරවූ ආරක්ෂණවාදී නීතිරීති මගින් මෙන්ම, පිටරටින් ගෙන්වන භාණ්ඩ සඳහා අධික ලෙස බදු අයකිරීම් මගින් ද ස්වකීය කර්මාන්ත රැක ගැනීමට එම රටවල් ක්‍රියා කළේය. එහෙත් 1977 න් පසු අප රටේ ක්‍රියාත්මක වූ විවෘත ආර්ථිකය යටතේ කිසිදු ආනයන ප්‍රතිපත්තියක් අපට තිබුණේ නැත. මෙහි නියත ප්‍රතිඵලය වූයේ එතුවක් කළක් සාර්ථක ලෙස වර්ධනය වෙමින් තිබූ දේශීය කර්මාන්ත හා ව්‍යාපාර බැඳවැටීමයි.

විදේශ ආයෝජනවලට සියලු පහසුකම් ලබාදුන්නත් රටට ලැබුණේ ඉතා සුළු විදේශ ආයෝජන ප්‍රමාණයක් පමණි. වැඩිපුර යෙදවනු ලැබුවේ දේශීය ආයෝජනයි. විවෘත ආර්ථිකය යටතේ විදේශ ආයෝජන ලැබුණේ කොතරම් සුළු ප්‍රමාණයක් ද යන්න පැහැදිලිවන්නේ අපගේ විදේශ රැකියා නියුක්තිකයන්ගෙන් ලැබුණු ආදායම සමග එය සසඳා බලනවිටය. 1994 වනවිට ඔවුන් එවූ විදේශ විනිමය ප්‍රමාණය ඩොලර් මිලියන 700 කි. වසර 2000 වනවිට මෙය ඩොලර් මිලියන 1200 දක්වා වැඩිවී තිබුණි. මේ දක්වා වැඩිම විදේශ ආයෝජන අපට ලැබුණේ 1997 වර්ෂයේදී ය. එම ප්‍රමාණය මිලියන 430 කි. එහෙත් අපේ දුප්පත් කාන්තාවන් සිය ශ්‍රමය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

විදේශවලට විකුණා රටට ලබාදෙන විදේශ විනිමය ප්‍රමාණය මේ විදේශ ආයෝජකයන් ලබාදෙන විනිමය ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩිය.

මේ අතර, මධ්‍ය හා කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයින් සහ කර්මාන්තකරුවන් ප්‍රශ්න රාශියක් මැද ජාතික නිෂ්පාදනයේ වර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් ලබාදී තිබේ. අපේ රටේ දේශීය පෞද්ගලික අංශයට තවමත් නායකත්වය ලබාදෙන්නේ මේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයින්ය. දළ ජාතික නිෂ්පාදනයෙන් 50% නිෂ්පාදනය කරන්නේ මේ අංශයයි. උදාහරණ වශයෙන් දැක්වුවහොත් තේ නිෂ්පාදනයෙන් 65% ක් ද, ඇඟලුම් කර්මාන්තයෙන් 50% ක් ද, ඉදිකිරීම් අංශයෙන් 35% ක් ද, බස් ගමනා ගමන සේවයෙන් 70% ක් ද, දේශීය වෙළඳාමෙන් 80% ක් සහ සංචාරක ව්‍යාපාරය හා විවේකය හා විනෝදාස්වාදය පදනම් කරගත් සේවාවන්ගේ 50% ක් ද පවත්වාගෙන යන්නේ මේ අංශයයි. එහෙත් මෙම අංශවලට ලබාදී ඇති රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවේ. 2001 න් පසු විශ්‍රාමිකයින්ගේ, ස්ථිර පඩි ලබන අයගේ, රජයේ සහ පෞද්ගලික අංශයේ ස්ථිර සේවකයින්ගේ හෝ අනියම් සේවකයින්ගේ සහ කොන්ත්‍රාත් පදනමත සේවය කරන කිසිවෙකුගේ වැටුප් වැඩිවී නැත. ඒ අතරතුරු භාණ්ඩ මිළ දිනපතා වැඩිවෙයි.

මේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම සඳහා එක්සත් ජාතික පෙරමුණ ඉදිරිපත් කර ඇති " යළි පුබුදමු ශ්‍රී ලංකා " යන ආර්ථික වැඩපිළිවෙළ අපට කිසිසේත් පිළිගත නොහැකිය. ඉහතින් විග්‍රහ කළ කිසිදු ප්‍රශ්නයකට මෙම වැඩපිළිවෙලින් විසඳුම් ලැබෙන්නේ නැත. ඒ වෙනුවට තවත් ප්‍රශ්න උග්‍රවීමේ අනතුරක් එමගින් නිර්මාණය කොට තිබේ. විරැකියාව තවත් උග්‍රවී මූල්‍ය ස්ථාවරත්වය ඉතා භයානක ලෙස පිරිහී යා හැකිය. මේ ආන්දමේ ප්‍රතිපත්ති අනුගමනය කළ ආජන්ටිනාව, මෙක්සිකෝව සහ ඉන්දුනීසියාව වැනි රටවල් බරපතල ආර්ථික අර්බුදවලට මුහුණ පා ඇති බව අපි දනිමු. එහෙත් චීනය, මලයාසියාව සහ ඉන්දියාව සිය ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් ලෙස වර්ධනය කරගෙන ඇත. ඔවුන් එම කාර්යය ඉටුකරගැනීමට සමත්වී ඇත්තේ තම රටවලට ආවේණිකවූ දේශීය ප්‍රතිපත්ති මත පදනම්ව ක්‍රියා කිරීම නිසාය.

කෙසේවුවද අද මුළු ලෝකයම පිළිගෙන ඇති වෙළඳපොල ආර්ථික මූල ධර්ම අප ප්‍රතික්ෂේප කරන බව මෙයින් අදහස් වන්නේ නැත. අප කළයුත්තේ එම වෙළඳපොල මූලධර්මයන් අපේ රටේ තත්ත්වයට ගැලපෙන අයුරින් සකස් කරගැනීමයි. අප වැදගත් යැයි සලකන දේශීය ක්‍රමවේදයන් සහ සාරධර්ම සමග වෙළඳපොල මූලධර්ම බද්ධ කිරීමට අපට අවශ්‍යයි. එමගින් සෑම ශ්‍රී ලාංකිකයෙකුටම සාධාරණ වන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනය මත පදනම්වූ, අපටම ආවේණිකවූ ආර්ථික වැඩපිළිවෙළක් සකස් කරගත හැකිය.

1994 සිට මේ ආකාරයෙන් ක්‍රියාකිරීමට අපි උත්සාහ කළෙමු. විශේෂ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම, බීජ නිෂ්පාදන සංවර්ධනය සඳහා විශේෂවූ වැඩපිළිවෙල සකස් කිරීම සහ සහල් හා අනෙකුත් කෘෂි නිෂ්පාදනවලට සහතික මිළක් ලබාදීම මේ අතර ප්‍රධාන විය. කුඩා වැව් ප්‍රතිසංස්කරණය, දේශීය කිරි නිෂ්පාදනය නගා සිටුවීම සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීමට 1994 න් පසු අපි පියවර ගත්තෙමු. 1994 ට කලින් පැවති අසාර්ථක ආර්ථික පාලනය නිසා වැඩිවී තිබූ ජීවන වියදම අඩුකොට, පාරිභෝගිකයින්ට අඩු මිළට භාණ්ඩ ලබාදීමට අපට සිදුවිය. එක් පැත්තකින් පාරිභෝගිකයා සනසන අතර, අනෙක් පැත්තෙන් ගොවියාට ඉහළ මිළක් ලබාදීමේදී මේ දෙක අතර මනා තුලනයක් පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයට ද අපි මුහුණ දුන්නෙමු. ගොවියාට පමණක් පූර්ණ සහනයක් සැලසීමට අපට නොහැකිවුයේ ඒ නිසායි.

කෙසේවුවද අපට ද වැරදුණ තැන් තිබෙන බව නිහතමානීව පිළිගත යුතුව තිබේ. එදා සිදුවූ වැරදි නිවැරදි කරගනිමින් ඉදිරියට යාම අපගේ අපේක්ෂාවයි. අපේ නව දර්ශනය වන්නේ රජයට හා විවෘත ආර්ථික යාන්ත්‍රණයට පැහැදිලි ලෙස බෙදා වෙන් කළ කාර්යයන් පවරාදීමයි. ඒ අනුව සකස් කර ඇති අපගේ ආර්ථික වැඩපිළිවෙළේ ප්‍රධාන ස්ථම්භ පහ මෙසේ ගෙනහැර දක්වමු.

1. ආහාර සුරැකිව තබාගැනීම පදනම් කරගත් කෘෂිකාර්මික සංවර්ධනය.
2. දේශීය සම්පත් පදනම් කරගත් කාර්මීකරණය

3. ගෝලීයවශයෙන් තරගකාරී වන්නාවූ සේවා අංශය ( විදුලිය, වරාය, විදුලි සංදේශ, ජලය, බැංකු හා රේගුව)
4. විවිධාංගකරණීය වූ අපනයන අංශය (නිෂ්පාදන මෙන්ම වෙළඳපොල)
5. මානව සම්පත් සංවර්ධනය, විද්‍යාව සහ තාක්ෂණය.

අපගේ ආර්ථික සංවර්ධන වැඩපිළිවෙළේ ක්‍රියාකාරී මධ්‍යස්ථානය වන්නේ දේශීය කර්මාන්ත හා සුළු කර්මාන්තයි. පිටරටින් ගෙන්වන භාණ්ඩ සමග තරගකාරිත්වයට මුහුණදීමට හැකිවන පරිදි දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය ආරක්ෂාව සලසා දෙනු ලැබේ. මේ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේදී රාජ්‍ය - පෞද්ගලික දෙඅංශයේම සහභාගීත්වය සහතික කෙරේ. රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර තරගකාරීත්වය ද දිරිගන්වනු ලැබේ. දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වලින් අඩුතීරු ගාස්තු අය කෙරෙන අතර, ගෙන්වනු ලබන සියලුම යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය සඳහා තීරු ගාස්තු අය නොකෙරේ.

- <u>ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.</u>

ආර්ථික සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කිරීමේදී අන්සියල්ලට කලින් යටිතල පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය වන්නේය. මනා යටිතල පහසුකම් නොමැතිව කිසිදු ආර්ථික සැළැස්මක් හරිහැර ක්‍රියාත්මක කළ නොහැකිය. මේ අනුව අපේ ආර්ථික වැඩපිළිවෙළේ පළමු අංකය වන්නේ මනා යටිතල පහසුකම් ලබාදීමයි. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ සඳහා අපි මෙම පහසුකම් ලබාදෙන්නෙමු. දේශීය කර්මාන්තවලට අවශ්‍ය වන විදුලිබලය, ජලය, දුරකථන සහ ප්‍රවාහන සේවාවන් අඩුමිළට ලබාදීම අපේ ප්‍රතිපත්තියයි. සෙසු සංවර්ධනය වන රටවල කර්මාන්ත නිෂ්පාදකයින්ට මෙම සේවාවන් ලබාදෙන්නේ ඉතා අඩුමිළටය. එහෙත් ශ්‍රී ලංකාවේ මේ සඳහා වැඩිම මිළක් ගෙවන්නට සිදුවී තිබේ.

අප ආරම්භ කළ අධිවේග මාර්ග තුනේ කටයුතු ඉක්මණින් සම්පූර්ණය කරන්නෙමු. කටුනායක- කොළඹ, මාතර - කොළඹ, කොළඹ - නුවර,

සහ කොළඹ නගරය වටා රවුම් පාර මෙම මාර්ගයි. මේවා දූෂණයෙන් තොරව ඉතා කඩිනමින් නිම කරන්නෙමු. ග්‍රාමීය මාර්ග අඛණ්ඩව ප්‍රතිසංස්කරණයට භාජනය කිරීමටත්, අලුත් මාර්ග සකස් කිරීමටත් නව වැඩපිළිවෙළක් සකස් කර ඇත්තෙමු. මේ සඳහා දේශීය ඉදිකිරීම් අංශය සෘජුවම සම්බන්ධ කරගනු ලැබේ.

දුරකථන හා ගමනා ගමන සේවා සඳහා රජය සහ පෞද්ගලික අංශය දැනටමත් සම්බන්ධවී සිටී. මෙම සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීමේ සැළැස්මක් අපි සකස්කොට ඇත්තෙමු. මෙම කටයුතු සඳහා රජයේ අනුග්‍රහය මීට වඩා ලබාදෙනු ඇත.

අප ද්‍රව්‍ය ඉවත් කිරීම අද විශාල ප්‍රශ්නයක් වී තිබේ. මේ සඳහා අපි විශේෂ වැඩපිළිවෙළක් සකස් කරන්නෙමු. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හා කොළඹ වරාය අතර, (Air -Sea Cargo -Hub) " එයාර් සී කාගෝ හබ් " නමින් හැඳින්වෙන ගුවනින් සහ මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ඒකාබද්ධ වැඩපිළිවෙළක් අපි සකස් කිරීමට පොරොන්දුවී සිටියෙමු. ඒ සඳහා මූලික වැඩපිළිවෙළ ද අපි සකස් කළෙමු. මේ කටයුත්ත අවසන් කිරීමට අප තීරණය කොට ඇත.

- කෘෂිකර්මාන්තය

කෘෂිකර්මාන්තය නංවාලීමේදී එම ක්ෂේත්‍රයේ නිරත අයට හොඳ ආදායම් මාර්ග පාදාදීම අත්‍යවශ්‍ය වන්නේය. ස්වයංපෝෂිත ඉලක්කය ඉක්මවා ආහාර බෝග නිෂ්පාදනය වැඩිකිරීමටත්, වැඩිවන නිෂ්පාදන ප්‍රමාණය අපනයනය කිරීමටත් අපි සැළසුම් සකස් කොට ඇත්තෙමු. නිෂ්පාදනය කෙරෙන ආහාර සුරක්ෂිතව ගබඩා කර තබාගැනීමට මෙන්ම සිය නිෂ්පාදන සඳහා ගොවියාට හොඳ මිළක් ලබාදීමට ද අපි ක්‍රියා කරමු. මෙහිදී තේ, පොල් සහ වී නිෂ්පාදන ජාතික බෝග හැටියට අපි ප්‍රකාශයට පත් කරන්නෙමු. එම භෝග සඳහා විශේෂ පහසුකම් ලබාදෙන්නෙමු. තේ, පොල්, රබර් සහ උක් වැනි බෝග නිෂ්පාදනය කරන අයට විශේෂිතවූ බදු සහන ලබාදීමට අපි ක්‍රියා කරමු. ගොවීන්ගේ ඉඩම් අයිතිය සහතික කරන්නෙමු. නැවත බලයට පත්වී ප්‍රථම වසර

දෙකක් තුළදී අපි මෙම ඉඩම් අයිතිය තහවුරු කරමු. ගොවිතැන් කටයුතු සඳහා නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදෙන අතර, වෙළඳ පොළ පහසුකම් අවුරුදු තුනක් තුළදී ලබාදෙන්නෙමු. කෘෂි නිෂ්පාදන සඳහා අවම සහතික මිළක් ලබාදෙන අතර, ගොවි පුහුණු පාසැල් නවීකරණය කොට සංවර්ධනය කරන්නෙමු. එසේම නව කෘෂි තාක්ෂණ භාවිතා කිරීම සඳහා ගොවීන් දිරිගැන්වීමට කටයුතු කරන්නෙමු.

- වාරිමාර්ග

  කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ක්‍රමික වාරිමාර්ග පද්ධතියක් අවශ්‍යය. අපි විසින් ආරම්භ කරන ලද කුඩා වාරි ක්‍රම තවදුරටත් සංවර්ධනය කරන්නෙමු. මේ කටයුත්ත දූෂණයෙන් තොරව කාර්යක්ෂම ඉටුකිරීම සඳහා ජනතා සහභාගිත්වය ඇතිව නව වැඩපිළිවෙළක් සකස් කෙරෙනු ඇත.

- ධීවර කර්මාන්තය නංවාලීම.

  ධීවර කර්මාන්තය නංවාලීමේ දී මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. සියලුම මධ්‍යම ප්‍රමාණ වාරි ක්‍රමවලට මෙම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හඳුන්වා දෙන්නෙමු. මීගමුව හම්බන්තොට සහ මඩකලපුව වැනි ප්‍රදේශවල ඉස්සන් නිෂ්පාදන කලාප පිහිටුවීම ද අපේ වැඩපිළිවෙළට අයත්ය.

- සත්ව පාලනය හා කිරි නිෂ්පාදනය.

  අද කිරි නිෂ්පාදනයේ ප්‍රමුඛත්වයේ සිටින්නේ වැඩිහරියක් බහුජාතික සමාගම් සහ විශාල පරිමාණයේ සමාගම් අතලොස්සකි. කුකුළු මස්, බිත්තර වැනි නිෂ්පාදනවල නිරතව සිටින්නේ කුඩා නිෂ්පාදකයින්ය. මේ දේශීය නිෂ්පාදන දිරිගැන්වීමට අපි විවිධ බදු සහන ලබාදෙන්නෙමු. එසේම විශාල සමාගම් සහ කුඩා නිෂ්පාදකයින් අතර සම්බන්ධය තහවුරු වන අන්දමේ වැඩපිළිවෙළක් සකස්කරමු. එමගින් කුඩා නිෂ්පාදනකයින්ට හොඳ වෙළඳපොලක් ලබාගැනීමට

හැකිවෙයි. කුඩා කිරි නිෂ්පාදන අංශය සහ විශාල සමාගම් අතර සම්බන්ධතාවක් ඇති කොට මෙම ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති කිරීමට අපි සැළසුම් සකස්කොට ඇත්තෙමු. මෙමගින් සීනි, තිරිඟු සහ කිරිපිටි ආනයනය කිරීමට අවුරුද්දකට වැයවන රුපියල් කෝටි 3000 ක් ( මිලියන තිස්දහසක්) මුදලින් සෑහෙන ප්‍රමාණයක් ඉතිරි කරගැනීමට හැකිවනු ඇත. මෙම කෘෂි භාණ්ඩවලින් බොහොමයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ හැකිය. කෘෂි බෝග පිටරටින් ආනයනය කිරීමේදී විශේෂිතවූ අවම බද්ධක් අය කිරීමට ද අපි ක්‍රියා කරමු. මෙම පියවර ගන්නේ දේශීය නිෂ්පාදනය වැඩිකරගැනීමට අවශ්‍ය පියවර ගැනීමෙන් පසුවයි.

- <u>කර්මාන්ත සංවර්ධනය.</u>

දේශීය කර්මාන්ත දිරිගැන්වීම සඳහා දැනට පවතින බදු ක්‍රමය ප්‍රතිසංස්කරණයට පියවර ගන්නෙමු. මේ රටේ නිෂ්පාදනය කෙරෙන සිමෙන්ති, ටයර්, පිගන් මැටි භාණ්ඩ, ගොඩනැගිලි සඳහා අවශ්‍ය උපරකණ, කෘෂි උපකරණ, ලුහු ඉංජිනේරු භාණ්ඩ, සම් භාණ්ඩ සහ රබර් නිෂ්පාදන ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් අප සකස් කොට ඇත. අපනයන භාණ්ඩ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී අය කරන බදු අපේ ආණ්ඩුව සමයේදී අඩු කළෙමු. ඉදිරියේදී නැවත බලයට පත්වූ විට මෙම බදු සම්පූර්ණයෙන් අහෝසි කරන්නෙමු. මීට අදාල බදු සහ ආදායම් බදු ද සරල කොට දිරිගැන්වීම් ලබාදෙන්නෙමු. අපනයනය සඳහා විවිධ භාණ්ඩ නිෂ්පාදනය කරන අයට මෙම පහසුකම් සැළසේ.

කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත පර්යේෂණ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික අත්කම් භාණ්ඩ මණ්ඩලය සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය එකම අමාත්‍යාංශයක් යටතට පත්කොට නව කෘෂිකාර්මික සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කරන්නෙමු. මේ කටයුතු සඳහා ජාතික ව්‍යාපාර සංවර්ධන බැංකුවක් ද පිහිටුවන අතර, එම බැංකුව ද මෙම අමාත්‍යාංශය යටතට පත්කෙරේ. තවද ඉලක්ක කරගත් දේශීය කර්මාන්ත සඳහා ක්‍රියාකාරී සැළස්මක් අප සකස්කොට ඇත. මහා

පරිමාණයේ ව්‍යාපාර සඳහා දැනටමත් විශාල වශයෙන් ලබාදී ඇති ආධාර සහ දිරිගැන්වීම් ඒ ආකාරයෙන්ම ඉදිරියටත් පවත්වාගෙනු යනු ලැබේ.

- තොරතුරු තාක්ෂණය.

1994 වනවිට තොරතුරු තාක්ෂණය ඉගැන්වීමට හෝ එම තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ ඒවා දිරිගැන්වීමට රජයට කිසිදු ප්‍රතිපත්තියක් තිබුණේ නැත. 1995 සිට මෙම විෂය පාසල් විෂයමාලාවට ඇතුළත් කළේ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවයි. ඒ සඳහා පරිගණක යන්ත්‍ර මෙන්ම ගුරු පුහුණුව ද අපි ලබාදුන්නෙමු. මෙය අපේ නව අධ්‍යාපන ප්‍රතිපත්තියට සම්බන්ධ කොට ක්‍රියාත්මක කිරීමට අපට හැකිවිය.

එසේම තොරතුරු තාක්ෂණය පදනම් කරගත් කර්මාන්ත හා ව්‍යාපාරවලට ණය සහන සහ බදු සහන ඇතුළු සහනාධාර ගණනාවක් ලබාදෙනු ලැබිය. ප්‍රථම තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය මාලඹේ ආරම්භ කළ අතර ගම්පහ දිස්ත්‍රික්කයේ පූගොඩද තවත් එවැනි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සැළසුම් කර තිබුණි. එසේම ප්‍රධාන ආයතන දෙකකට සම්බන්ධව කුඩා පරිමාණයේ තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන පනහක් ඉදිකිරීමට ද අපි සැළසුම් කළෙමු.

එහෙත් එක්සත් ජාතික පෙරමුණ මේවා ක්‍රියාත්මක කරන්නේ නැත. දැනට අඩපනවී ඇති මෙම තොරතුරු තාක්ෂණ පුහුණු වැඩපිළිවෙළ අපේ නව ආර්ථික ප්‍රතිපත්තිය යටතේ යළි පනගන්වන්නෙමු. මේ වැඩපිළිවෙළ තුළින් හොඳ රැකියා ලබාදීමේ ව්‍යාපෘතියක් සකස් කර ඇත. ඉදිරියේදී තොරතුරු තාක්ෂණයට සම්බන්ධ කර්මාන්ත හා ව්‍යාපාර විශාල ප්‍රමාණයක් ආරම්භවීමට ඉඩ ඇත. මෙම ආයතන මෙහෙයවීම සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් ආයතනයක් පිහිටුවන්නෙමු.

- <u>සුළු කර්මාන්ත හා අත්කම් භාණ්ඩ.</u>

මේවා අපේ සම්ප්‍රදායන්ට අවේණිකවූ කර්මාන්තයි. දශක ගණනාවක් තිස්සේ මේවා අඩපණවී ඇත. අද ඉන්දියාවේ විදේශ විනිමය උත්පාදනය කරන එක් අංශයක් වන්නේ අත්කම් භාණ්ඩ අපනයනය යි. නවීන මෝස්තර සහිතව අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට පසුගිය කාලයේදී අප ලබාදුන් පහසුකම් මෙම ආණ්ඩුවෙන් නවතා දමා ඇත. මේවා නැවත වතාවක් සම්ප්‍රදානුකූලව නිෂ්පාදනය කිරීමටත්, එම නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොලක් ලබාදීමටත් අපි කටයුතු කරන්නෙමු. ප්‍රාදේශීය වශයෙන් හා පළාත් වශයෙන් අත්කම්භණ්ඩ නිෂ්පාදනයටත්, අලෙවි කිරීමටත් පළාත් සභා මගින් වැඩපිළිවෙළක් සකස් කර ඇත. මේ භාණ්ඩ සඳහා විදේශ වෙළඳපොල විවෘත කරගැනීම ද මෙම වැඩපිළිවෙළේම කොටසකි.

- <u>ආර්ථික සංවර්ධන සඳහා කාන්තා සහභාගීත්වය.</u>

ශ්‍රී ලංකාවේ විදේශ විනියම වැඩියෙන්ම උපයන්නන්ගෙන් 75% කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන්ය. ඇගලුම්, විදේශ රැකියා සහ තේ කර්මාන්තය වැනි ක්ෂේත්‍රවල යෙදී සිටින්නේ ද කාන්තාවන්ය. එහෙත් දේශීය ආර්ථිකයේ ඉදිරි ගමනට කාන්තාවන්ගේ නායකත්වය ලබාගැනීම අඩුය. හුදෙක් ශ්‍රමය වැය කරන සේවක පිරිසක් හැටියට විනා නායකත්වය ලබාදෙන පිරිසක් වශයෙන් කාන්තාවන් සහභාගි කරවාගැනීමේ අඩුවක් පවතී. මෙයට විසඳුමක් වශයෙන් පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ ව්‍යාපාරවල නායකත්වය ලබාගැනීම පිණිස අවශ්‍ය පහසුකම් කාන්තාවන්ට ද ලබාදෙන විධි සහ ක්‍රම අපි සකස්කර ඇත්තෙමු. ඒ සමගම ඉහතින් සඳහන් කළ අත්කම් භාණ්ඩ නිෂ්පාදනය ස්වයං රැකියාවක් වශයෙන් කරන තරුණයන්ට මෙන්ම තරුණියන්ට ද අවශ්‍ය පහසුකම් ලබාදීමට අපි සැළසුම් කර ඇත්තෙමු.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

- <u>පෞද්ගලීකරණය.</u>

අපේ නව ආර්ථික ප්‍රතිපත්තිය යටතේ දුම්රිය, පොකුරු බස් සමාගම්, ඛණිජ තෙල්, විදුලිය, වරාය, ගුවන්තොටුපල, ජල සැපයුම සහ රාජ්‍ය බැංකු පෞද්ගලීකරණයට භාජනය කරනු නොලැබේ. ආර්ථික වශයෙන් ඉතාමත් වැදගත් වන මෙම ආයතනවල මනා කළමණාකරණය සඳහා විශේෂ ව්‍යවස්ථාවක් මගින් එම ආයතනවලට වාණිජමය ස්වතන්ත්‍රභාවයක් ( ස්වාධීනත්වයක් ) ලබාදෙනු ඇත. දේශපාලන බලපෑම්වලින් තොරව මේවා අධීක්ෂණය කිරීම සඳහා වෙනමම ස්වාධීන ආයතනයක් පිහිටුවනු ලැබේ. පාරිභෝගිකයින්ට හා සේවකයින්ට කොටස් ලබාදීම සඳහාත්, මෙම සමාගම්වල වගකීම් සහිතභාවය මහජනතාවට සහතික කරනු සඳහාත්, මෙම ආයතනවල කොටස්වලින් සුළු ප්‍රමාණයක් කොළඹ කොටස් වෙළඳපොළේ ලේඛණගත කෙරෙනු ඇත. මෙම ආයතනවල ප්‍රාග්ධන කොටස්වලින් තුනෙන් දෙකක් හැමවිටම ආණ්ඩුව යටතේ තිබිය යුතුය. කිසිදු කොටස්කරුවෙකුට ප්‍රාග්ධන කොටස්වලින් 2% ට වඩා වැඩි ප්‍රමාණයක් මිළදී ගැනීමට අවසර දෙනු නොලැබේ.

එතරම් වැදගත් නොවන ආයතන පුද්ගලීකරණය කරන්නේ එම ආයතනවල පැවැත්ම රජයේ අයිතිය යටතේ තවදුරටත් තිබිය යුතු ද යන්න සාධාරණීය කළ නොහැකි නම් හෝ එම ආයතනවල වාණිජමය වලංගුභාවය සහතික කිරීමට වෙනත් විකල්පයක් නැති අවස්ථාවලදී පමණි.

කෙසේවුවද මේවා පෞද්ගලීකරණය කිරීම සඳහා තීරණයක් ගැනීමට කලින් අවශ්‍ය ප්‍රතිව්‍යුහගත සැළසුම් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව පොදු ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම ( පර්ක් ආයතනය ) මගින් සෑම ප්‍රයත්නයක්ම දරණු ඇත.
මෙසේ දේශීයත්වය සමග බද්ධවූත් රටේ හා ජනතාවගේ අවශ්‍යතාවන් හොඳින් හඳුනාගන්නාවූත්, සමාජ සංවර්ධනයට හා ජනතා සුභසාධනයට මුල්තැන දෙන්නාවූත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කරගත් නව ආර්ථික සැළැස්මක් අපි ක්‍රියාත්මක කරන්නෙමු.

# 4. ජනතාවාදී ලෙන්ගතු පාලනය

සමාජ සාධාරණත්වය සහ ජනතා සුභසාධනය පෙරදැරි කරගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති අතරින් ප්‍රමුඛතාවක් ලැබෙන අනෙක් අංශය වන්නේ ජනතාවාදී ලෙන්ගතු පාලනයක් පවත්වාගෙන යාමයි. ජනතාවාදී ලෙන්ගතු පාලනයක් යනු දියුණු අධ්‍යාපන හා සෞඛ්‍යය ක්‍රමයක් මගින් සැමට වරප්‍රසාද ලැබෙන සහ මානව දයාව පෙරදැරි කරගත් සමාජ සුභසාධනයට පියවර ගැනීමයි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී රටේ සැබෑ සම්පත වන ජනතාව ප්‍රමුඛත්වයෙහිලා කටයුතු කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බැඳී සිටී. රටක සමාජ ආර්ථික සංවර්ධනයට අදාල ජාතික න්‍යාය පත්‍රයේ මානව සම්පත් සංවර්ධනයට පමුඛත්වයක් දියයුතු යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කල්පනා කරන්නේ ඒනිසාය.

මානව සම්පත් සංවර්ධනය යනු හුදෙක්ම ජාතික ආදායම ඉහළ දැමීම හෝ පහළ දැමීම හෝ පිළිබඳ කරුණක් නොවේ. එය ඵලදායීතාවයෙන් යුත් නිරෝගී ජීවිත පවත්වාගෙන යාමටත්, හැකියාවන් උපරිම ආකාරයෙන් විකසිත කර ගැනීමටත් ජනතාවට ඇති අවස්ථාවන් පුළුල් කරදෙන ක්‍රියාවලියකි. මානව සම්පත් සංවර්ධනය හා මානව හිමිකම් අතර ඇත්තේ එකිනෙකින් වෙන් කළ නොහැකි සම්බන්ධතාවකි. මානව නිදහස මේ දෙඅංශයේම පොදු දෘෂ්ඨිය හා පොදු අරමුණය. අපේ රටේ ඉදිරි ගමනේදී ජනතාව රටේ සැබෑ සම්පත හෙයින් ජනතාව තුළ ආයෝජනය කිරීමට ප්‍රමුඛතාව ලබා දිය යුතුය. ජනතාව තුළ ආයෝජනය කිරීම දෙආකාරයකින් සිදුකළ හැකි ය. පළමුව නිරෝගී සම්පන්න ජනතාවක් බිහිකිරීමට සෞඛ්‍ය කෙෂේත්‍රයේ ද, දෙවනුව ජනතාවගේ විභව ශක්තීන් දැනුම, නිපුණතා, ආකල්ප වර්ධනය කිරීමෙහි ලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද කරනු ලබන ආයෝජනයන් වේ.

## නූතන අභියෝගයට මුහුණ දෙන අධ්‍යාපන පෙරළිය

සැම දෙනාට ම සම අවස්ථා සලසා දීමට යත්න දරමින් විශිෂ්ට අධ්‍යාපනයකට මංපෑදීම අධ්‍යාපන ක්ෂෙත්‍රයේ අපේ දර්ශනයයි. එය ලොවපුරා නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ද දර්ශනය වන්නේ ය. අද බටහිර යුරෝපයේ නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ පිළිගෙන ඇති ආකාරයට ඔවුන්ගේ සමාජ සුභසාධන ප්‍රතිපත්තියේ ප්‍රමුඛතා අනුපිළිවෙල පළමුවන, දෙවන හා තෙවන

ස්ථාන හිමිවී ඇත්තේ අධ්‍යාපනටයි. අධ්‍යාපනයේ අවශ්‍යතාව අද අන්කවරදාවකටත් වඩා ඉස්මතු වී ඇත. දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කරනු ලබන අයෝජනය සම්පත් සාධාරණ ලෙස යළි බෙදාහැරීමේ ප්‍රධාන පදනම ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු සලකති.

ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසයේ පෙර නොවූවිරූ ආකාරයකට ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අංශ ඇතුලත් කර ගනිමින් දූරදර්ශි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් 1998 සිටම පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ක්‍රියාත්මක කළේය. ජනතාවගේ සුභසෙත අභිමානය, ආරක්ෂාව සහතික කිරීම මෙහිදී ප්‍රධාන වන්නේ ය. මූලික පහසුකම් හා රැකවරණය සහිත සතුටුදායක ජීවන රටාවක් සලසාදීම මෙහිදී පළමු අවශ්‍යතාවයි.

මේ ප්‍රතිසංස්කරණවල ඉදිරි දැක්ම වනුයේ 21වන සියවසේ ගෝලීය සමාජ ආර්ථික ක්ෂෙත්‍රයේ සිදුවන්නා වූ ශීඝ්‍ර වෙනස්කම්වලට මුහුණදීමට හැකිවන අයුරින් අත්‍යවශ්‍ය දැනුමෙන්, හැකියාවන්ගෙන් හා ආකල්ප වලින් අපගේ ළමා පරපුර සන්නද්ධ කෙරෙන අපේ අධ්‍යාපන ක්‍රමය විප්ලවීය පරිවර්තනයකට හා නවීකරණයකට ලක් කිරීමය. අපේ ප්‍රතිපත්තිය යොමු වී තිබුණේ ගෝලීය වෙනස්කම්වලට අනුකූලවන්නා වූ නිර්මාණාත්මක දිශාවකට ය. එසේම එය ඉදිරි දශකයේ දී අපේ රට උදාකර ගැනීමට අපේක්ෂා කරන්නාවූ දැනුම හා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සමාජයේ කොඳු නාරටිය වන ළමා පරපුරක් හැඩගස්වා ගැනීම කෙරෙහි යොමු වී තිබුණි.

පාසල්වලට හා විශ්වවිද්‍යාල පද්ධතීන්ට හඳුන්වාදුන් ශිෂ්‍ය කේන්ද්‍රීය හා ක්‍රියාකාරකම් මූලික විෂය මාලා ප්‍රතිසංස්කරණවල අරමුණ වූයේ යොවුන් පරපුරේ පරිකල්පන ශක්තීන් ප්‍රබෝධමත් කිරීම, ඔවුන්ගේ කුතුහලයන් අවදි කිරීම, ගැටුම් නිරාකරණය කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම හා අද පවතින සමාජයේ විවිධාකාර අභියෝගයන්ට මුහුණදීමේ හැකියාවන් ඔවුන් තුළ කාවැද්දීමය. එය තරඟය මත පදනම් වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ප්‍රවීණත්වය පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීමේ සුවිශේෂ වූ ක්‍රියාදාමයකි.

නව පාඨ ග්‍රන්ථ හා නවීන ගුරු පුහුණු විධික්‍රමවල සහාය ලබා ගනිමන් බිහිවූ අලුත් ඉගැන්වීමේ ක්‍රම ඔස්සේ හඳුන්වා දුන් නව විෂය මාලාවන් ද 1997 දී පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවනු ලැබූ ජාතික ඇගයීම් හා විභාග සේවා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිව්‍යුහගත කරනු ලැබූ විභාග හා පාසල් මට්ටමේ

ඇගයීම් ද ක්‍රියාත්මක කරනු ලැබිණි. 1998 දී අනිවාර්ය අධ්‍යාපන පනත හඳුන්වාදීමෙන් ප්‍රාථමික හා ද්විතියික පාසල්වලට සිසුන් බඳවා ගැනීම වඩාත් තහවුරු කෙරිණි. ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ වෘත්තිය හැකියාවන් දියුණු කිරීම, නායකයන් හා කළමනාකරුවන් බවට පත්වීමට හැකිවන පරිදි ඔවුන් සවිබල ගැන්වීම, වැඩි දියුණු කිරීම හා වඩා යහපත් පාඨශාලා පාලනයක් සඳහා පාසල් මූලික කළමනාකරණය හඳුන්වාදුන් අනෙකුත් ප්‍රධාන අංගයන්ය.

වර්තමානයේ ප්‍රධාන අභියෝගය වන්නේ දැනට ක්‍රියාත්මක වන සිංහල හා දෙමළ ඉගැන්වීම් වැඩි දියුණු කරමින් ම ඉංග්‍රීසි ඉගැන්වීම ශක්තිමත් කිරීම ය. සමහර පන්තිවලට වෛකල්පික ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයක් ලබාදීම සඳහා පසුගිය වසරේ දී හඳුන්වා දුන් අවස්ථාව ඉදිරියේ දී ක්‍රමයෙන් ශක්තිමත් වනු ඇත. සියලුම පන්ති සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වාදීමට නියමිතය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් යෝජනා වූ තොරතුරු තාක්ෂණය පාසල් විෂයමාලාවට අන්තර්ගත විෂයයන් ලෙස හඳුන්වා දීම ඉදිරියේ සාර්ථකව ක්‍රියාත්මක වනු ඇත. ජ්‍යෙෂ්ඨ පාසල්වල විද්‍යා හා ගණිතය ඉගෙන ගැනීමේ අවස්ථාවන් පුළුල් කිරීම සඳහා පසුගිය වසරේ දී සකස් කරනු ලැබූ වැඩසටහන ඉදිරියේ දී තවදුරටත් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ඇත.

නවෝදයා වැඩපිළිවෙල මාර්ගයෙන් ග්‍රාමීය පාසල් නවීකරණය කිරීම සඳහා ආරම්භ කළ විශේෂ වැඩසටහන් (උදාහරණ - සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයකින් ම තෝරා ගත් පාසලක් සංවර්ධනය කිරීම) කඩිනමින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළයුතුව තිබේ. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාල, වතුකරයේ පාසල් හා උතුරු නැගෙනහිර පාසල් වැඩි දියුණු කිරීම මේ වැඩ පිළිවෙලට අයත් ය.

පළමුවන ශ්‍රේණියේ පෝෂණ වැඩසටහන, ජ්‍යෙෂ්ඨ පාසල් සිසුන් සඳහා උපදේශක හා නියාමක සේවා ලබාදීම, අපහසුතාවන්ට ලක්වුවන් සඳහා වූ ශිෂ්‍යත්ව ව්‍යාපෘතින්, නොමිලයේ දෙන පාසල් පොත් හා නිල ඇඳුම් බෙදාදීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම යනාදි වශයෙන් වූ විශාල පරාසයක් අන්තර්ගත වන පරිදි හඳුන්වාදුන් සුභසාධන වැඩසටහන් තවදුරටත් පුළුල් කර කාර්යක්ෂමව ක්‍රියාත්මක කළයුතුව තිබේ.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා කැපී පෙනෙන ප්‍රතිසංස්කරණ යෝජනා කර තිබේ. ඒවා පහත සඳහන් අංශ කෙරෙහි යොමු වී ඇත.

- රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධති පුළුල් කිරීම, ඒවාට ලබාදෙන මූල්‍ය හා අතිකුත් පහසුකම් වැඩි කිරීම.
- විෂයමාලා හා පාඨමාලා විවිධාංගිකරණයට ලක් කිරීම, පාඨමාලා ඒකක විෂය නිර්දේශවලට අන්තර් පීඨ සම්බන්ධිකරණයක් හඳුන්වා දීම
- අධ්‍යයන විෂය ධාරාවන් තෝරා ගැනීමේ දී නිදහස හා නම්‍යශීලී භාවය තහවුරු කිරීම.
- පුද්ගලික අංශය හා කර්මාන්ත අංශය සමඟ විධිමත් ආයතනික සම්බන්ධතා ඇති කිරීම.
- උපදේශන සේවාවන්, මෙහෙයවීම් සේවාවන් ලබා දීම.
- නව පරිපාලන ක්‍රම- විශ්වවිද්‍යාලවලට හා උපකුලපතිවරුන්ට ස්වාධීනත්වය ලබා දීම
- කාලීන ගෝලීය රැකියා වෙළෙඳ පොලේ අවශ්‍යතාවන් ට මුහුණ දිය හැකිවන ආකාරයට විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම.
- ආචාර්ය මණ්ඩල වැඩි දියුණු කිරීම කාර්යසාධන ඇගයීම්

මේ ආකාරයට වසර තුනකට පෙර දී අප හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් යටතේ වඩාත් ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## මානව දයාව පෙරදැරි කරගත් විශිෂ්ඨ සෞඛ්‍ය සේවාවක්

ජනතාවාදි ලෙන්ගතු පාලනයක් පෙරදැරි කරගත් ආණ්ඩුවක අනෙක් ප්‍රමුඛතාව වන්නේ නිරෝගි සම්පන්න ජනතාවක් බිහි කිරීමයි.

අපේ රට හා සමාන ආදායම් මට්ටමක් ඇති අනිකුත් රටවල් හා සසඳා බලන කල ශ්‍රී ලංකාවේ යහපත් සෞඛ්‍ය දර්ශකයන් දැනට දක්නට හැකි වුවද, වර්ධනය වෙමින් පවතින ජන ව්‍යාප්ති රටාවන් සහ අනිකුත් වෙනස්කම් නිසා අපේ රටේ ජනතාව ගොදුරු කර ගන්නා රෝග පීඩා පැතිරයාමේ නව තත්ත්වයන් මතු වී තිබේ. එසේම පිළිකා, දියවැඩියාව, හෘද රෝග ස්වාසානබාධ වැනි රෝග ද අතිශය දරුණු ඔත්පලවීම් ද වර්ධනය වී තිබේ.

රාජ්‍ය අංශයේ රෝහල්වල පවත්නා තදබදය, ශල්‍යකර්ම සඳහා ලැයිස්තුවලට ඇතුළත් ව දිගු කලක් බලාසිටීමට සිදුවීම, අකාර්යක්ෂම විශේෂඥ උපදේශක සේවා සහ මූලික චිකිත්සාවන් සඳහා අවශ්‍ය පහසුකම් හිඟවීම යනාදිය හේතු කොටගෙන පුද්ගලික බටහිර හා ආයුර්වේද වෛද්‍ය සේවාවන්හි පිහිට පැතීමට රෝගීහු පෙළඹී සිටිති.

මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් 1998 දී යෝජනා කරනු ලැබූ සෞඛ්‍ය ප්‍රතිසංස්කරණ මගින් ප්‍රජා සෞඛ්‍ය අවශ්‍යතාවන් හඳුනා ගැනීම හා ඒවාට ප්‍රමුඛත්වයක් දීම, පළාත් අධිකාරීන් ට අවශ්‍ය බලතල පවරා දෙමින් රජයේ රෝහල් අංශය සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම, සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, විවිධාකාරයේ ආදායම් උපයන මාර්ග ඔස්සේ සෞඛ්‍ය සඳහා වූ මානව හා අනිකුත් සම්පත් උපයෝජනය හා සෞඛ්‍ය අංශයේ වෘත්තිකයන්ගේ කාර්ය සාධනය දියුණු කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණි.

මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අමතරව උසස් ගණයේ පුද්ගලික අංශයේ ආයෝජනයන් දිරිමත් කරමින් රට පුරා ද්විතියික හා තෘතියික මට්ටමේ පුද්ගලික රෝහල් ආරම්භ කිරීමේ වැඩසටහන් සකස් කෙරුණි.

පුද්ගලික අංශයේ සියලු සෞඛ්‍ය ආයතන සඳහා නියාමක ක්‍රම හා ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා විධිවිධාන යොදනු ලැබේ. යථා පරිදි සැළසුම් කරනු ලබන සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් සමග පුද්ගලික හා රාජ්‍ය අංශයේ මිශ්‍ර දායකත්වයෙන් හා අන්තර් සහාතාධාර ක්‍රමවලින් යුක්ත උසස් සෞඛ්‍ය සේවා අයාතන පිහිටුවීමට නියමිතය.

පාසල් මට්ටමේ පෝෂණ වැඩසටහන් හා මාතෘ හා දාරක චිකිත්සා සායන ආශ්‍රිත ක්ෂේත්‍ර මට්ටමින් ළමුන්ගේ හා ගැබිණි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වයන් දියුණු කෙරෙනු ඇත. පෘථුල සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්වල ආධාරයෙන් හා ප්‍රාථමික

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

නිවාරණ උපක්‍රම මගින් බෝවන රෝග අවම කිරීමට කටයුතු කෙරෙනු ඇත. සාර්ථක වී ඇති පුළුල් කරන ලද ප්‍රතිශක්තිකරණ වැඩසටහන ශක්තිමත් කොට දියුණු කරනු ලැබේ.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු මගින් ඖෂධීය පැලෑටි පදනම් කරගත් වෛද්‍ය ක්‍රම නංවාලමින් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයුර්වේද වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කරමින් දේශීය වෛද්‍ය ක්‍රමය නංවාලීමට පුළුල් ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබේ. මානසික හා කායික ආබාධවලින් පෙළෙන අය සහ ශීඝ්‍රයෙන් වැඩිවන වැඩිහිටි ජනගහනය වැනි වරප්‍රසාද රහිත කොටස් සඳහා උපරිම සෞඛ්‍ය රැකවරණය ලබා දෙන අතර, ළමා රෝග පිළිබඳ දියුණු හා විශේෂඥ සේවා මධ්‍යස්ථාන මගින් ළමා සෞඛ්‍ය සේවා වැඩි දියුණු කෙරේ.

අපේ රටේ මෙන් ම කලාපයේ අනිකුත් රටවල ජනතාවට ද පහසුකම් සලසන මට්ටමේ දියුණු සෞඛ්‍ය සේවාවන් සැපයිය හැකි විශිෂ්ට ගණයේ ආයතන පිහිටුවීමට හැම අතින් ම දිරිගන්වනු ලැබේ. කරුණාව, දයාව හා සැලකිල්ල පෙරදැරි කරගත් විශිෂ්ට හා සමාන සේවාවන් සපයන නවීන ක්‍රමවලින් සමන්විත සෞඛ්‍ය අංශයක් ගොඩනැගීම අපගේ ඉදිරි දර්ශනයයි.

## කාන්තාවන් හා ළමුන්

අපගේ ආර්ථික වැඩ පිළිවෙලේදී පෙන්වාදුන් පරිදි ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වැඩියෙන්ම උපයන්නන්ගෙන් සියයට 75 කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන්ය. ඇඟලුම්, විදේශ රැකියා සහ තේ කර්මාන්ත යන ක්ෂේත්‍රවල යෙදී සිටින්නේ ද කාන්තාවන් ය. මෙම කාන්තාවන් ඇතුළු සමස්ත කාන්තා පරපුරේම සුභසාධනය වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බැඳී සිටී.

සැලකිය යුතු තරමේ ඉහළ මට්ටමක පවතින කාන්තාවන්ගේ ආයුකාලය, පහළ මට්ටමේ පවතින මාතෘ හා ළදරු මරණ අනුපාතය, ඉහළ අගයකින් යුක්ත කාන්තා සාක්ෂරතාව, පාසල් යන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව, සතුටුදායක මට්ටමක පවතින කාන්තා සේවා නියුක්තිය යන කරුණු අප රටේ කාන්තාවන්ට ලබා දී ඇති ජයග්‍රහණ කිපයකි. දණ්ඩ නීති සංග්‍රහයට අත්‍යවශ්‍ය සංශෝධන එක් කරමින් පනතක් ඉදිරිපත් කොට කාන්තා අයිතීන් තැවත බලගැන්වීම හා කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් හා අපයෝජනයෙන් බේරා ගැනීමේ විධිවිධාන හඳුන්වාදීමට පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව පියවර ගත්තේ ය.

අංශ දෙකකට සම්බන්ධ වී එනම් විදේශ රැකියාවන් හි නියුක්ත කාන්තාවන් හා අපනයන ප්‍රවර්ධන කලාපවල වැඩකරන කාන්තාවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධනය තහවුරු කිරීමේ නව ක්‍රියාමාර්ග ඉතා මෑතක දී ගනු ලැබිණි.

විශේෂ ජනාධිපති කාර්යසාධක බලකාය මගින් ආරම්භ කරන ලද ක්‍රියාකාරකම් තුළින් ඉහත කී කාන්තාවන්ට අත්‍යවශ්‍ය තොරතුරු ලබාදීම, මතුවන සියලුම තත්ත්වයන් ඉදිරියේ ගනුදෙනු කළ හැකි වන ආකාරයට අවශ්‍ය දැනුම හා හැකියාවන් ප්‍රවර්ධනය ආදි වැඩසටහන් තිසි පරිදි ආයතන ගත කෙරිණි.

කාන්තාවන්ගේ සෞඛ්‍ය පෝෂණය, මානසික හා සාමාජික යහපැවැත්ම ඉදුම්-හිටුම් හා ආරක්ෂාව, ආයෝජන ප්‍රවර්ධන කලාපවල ඇහළුම් හා අතිකුත් කර්මාන්තවල සේවාවන්හි නිරතවීමේදී මතුවන අනිකුත් අභියෝග හා ගෘහස්ථව හා විදේශ සේවා නියුක්තයේ දී මතුවන ගැටළු යනාදියට අදාළ විවිධ අංශ පිළිබඳ අවධානය යොමු විය.

මෙම වැඩසටහන් ශක්තිමත් කිරීමට අමතරව වතුකරයේ කම්කරු කාන්තාවන්ගේ සෞඛ්‍ය, පෝෂණය, යහපැවැත්ම විශේෂයෙන් ඉලක්ක කරගත් වැඩසටහන් හඳුනා ගනිමින් ක්‍රියාත්මක කෙරිණි.

ළමුන් සම්බන්ධයෙන් සංවේදී වී (උදාහරණ- ළමුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය හා ආරක්ෂාව හා ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම) අද දවසේ දියුණු රටවල හා දියුණු වෙමින් පවත්නා රටවල ප්‍රමුඛතාවට ලක්වී ඇති කරුණකි. ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගන්නා වූ දැනටත් සඳහන් කර ඇති පියවර හැරුණු විට ළමුන් ප්‍රචණ්ඩත්වයෙන්, ලිංගික හා කායික අපයෝජනයන්ගෙන් ළමා ශ්‍රමයෝජනයෙන්, පාසල් මට්ටමේ කෲර දඬුවම්වලින් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ප්‍රයත්න දරා තිබේ. 1997 දී ප්‍රතිෂ්ඨාපනය වූ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය මගින් ද හඳුන්වා දෙනු ලැබූ විවිධ නිතිමය ක්‍රමෝපායන් මගින් ද ළමුන් උදෙසා ලබා දුන් ප්‍රමුඛතාව පැහැදිලි ව ප්‍රකාශ වී තිබේ.

මත්පැන්, දුම්වැටි හා විෂ මත්ද්‍රව්‍යවලින් ළමුන් බේරා ගැනීම බරපතල ලෙස අවධානයට ලක් වූ කරුණක් විය. මතින් තොර පාසල් හා මතින් තොර සමාජයක් බිහි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අපි දැනටමත් ආරම්භ කර ඇත්තෙමු. මත්ද්‍රව්‍ය, ප්‍රචණ්ඩත්වය, අසභ්‍ය ප්‍රකාශන, ලිංගික සූරාකෑම, ළමා

ශ්‍රමය, ළමා අපයෝජනය යනාදී දුර්ගුණාංග වලින් තොර සමාජයක් සාක්ෂාත් කිරීම අපගේ ඉලක්කයයි.

නිදහස් අධ්‍යාපනය මෙන් ම නොමිලයේ පවත්වා ගෙන යන සෞඛ්‍ය සේවාවද මානව සම්පත් සංවර්ධනයේ ප්‍රමුඛතා ලෙස සළකා ඉදිරියටත් ඒවා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බැඳී සිටී.

-------------------


# 5. වගකීම් සහගත විවෘතභාවය.

අද ශ්‍රී ලාංකීය සමාජය සමාජ ආර්ථික හා සංස්කෘතික ආදි සෑම අංශයකින්ම බරපතල පිරිහීමකට ලක්වී ඇත. අප කවදත් අගය කළ සාරධර්ම පිරිහී ගොස් දූෂණය ඉහවහා ගොස් තිබේ. රජයේ ගනුදෙනු වලදී පාරදෘශ්‍යතාවක් හෝ වගකීම් සහගත බවක් හෝ දක්නට නොලැබේ. සමාජයේ සෑම අංශයක්ම දැඩි දේශපාලනීකරණයට ලක්වී ඇත. මේ තත්ත්වය වහා පිටුදැකිය යුතු යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කල්පනා කරයි. එය කළ හැක්කේ ඉදිරි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් යටතේ ප්‍රශස්ථ පාලනයක් පවත්වාගෙන යාමෙනි. මේ සඳහා අප සකස්කර ඇති වැඩපිළිවෙල මේ සමග ඉදිරිපත් කරමු.

ජනතාවට ආර්ථික වර්ධනයේ උපරිම ඵල නෙලා ගැනීමට හැකි වනුයේ ප්‍රශස්ථ පාලනයක් තුළින් පමණි. ආර්ථික වර්ධනය හා ප්‍රශස්ථ පාලනය සමීප සම්බන්ධතාවයකින් වෙලී ඇත. ප්‍රශස්ථ පාලනයක් නොපැවතීම ආර්ථික වර්ධනය අඩාල වීමට හේතුවේ. අනෙක් අතට ප්‍රශස්ථ පාලනය තුළින් ආර්ථික වර්ධනය වේගවත් වීමත්, ආර්ථික වර්ධනය තුළින් ප්‍රශස්ථ පාලනය සවිමත් වීමත් සිදුවනු ඇත.

<u>ප්‍රශස්ථ පාලනය යනු කුමක්ද?</u>

රජය, පෞද්ගලික අංශය, සිවිල් සමාජය යන තෙවැදෑරුම් අංශ එකිනෙක තුළින් බලාපොරොත්තු වන අපේක්ෂාවන් ඉටුකර දීම සඳහා දේශයේ සම්පත් හා ක්‍රියාකාරකම් පාරදෘෂ්‍ය, මනා වගකීමකින් යුතුව, සාධාරණව හා ජනතාවගේ අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි මනාව කළමනාකරණය කිරීම ප්‍රශස්ථ පාලනය වශයෙන් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රශස්ථ පාලනය යන්න අදාල කර ගැනීමේදී එය රජය, පෞද්ගලික අංශය හා සිවිල් සමාජයේ අන්‍යොන්‍ය හිතවාදී පාලනයක් ඇතිකර ගැනීමක් ලෙස අර්ථ දැක්විය හැකි අතර, මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා මනාව සකස් වූ ආයතන හා යාන්ත්‍රනයක් අවශ්‍ය වේ.




## ප්‍රශස්ථ පාලන අපේක්ෂාවන්

සිවිල් සමාජය හා පෞද්ගලික අංශය රජයෙන් අපේක්ෂා කරනු ලබන්නේ පූර්ණ වගකීම(Accountability), පාරදෘෂ්‍යතාවය, දූෂණයෙන් තොරවීම සහ කාර්යක්ෂමතාවයයි. පූර්ණ වගකීමක් නොමැතිවීම ප්‍රශස්ථ පාලනයක් නොමැති වීමට බලපාන ප්‍රධාන සාධකයක් නිසා සම්පත් කළමනාකරණයේදී පූර්ණ වගකීම ඉහළ මට්ටමකින් බලාපොරොත්තු වේ. සියළු පොදු ගනුදෙනු පාරදෘෂ්‍ය විය යුතුය. දූෂණයෙන් තොර කාර්යක්ෂම ජනතා සේවයක් ක්‍රියාත්මකවීම මෙම අපේක්ෂා පද්ධතියේ ප්‍රමුඛතාවයට පත්ව ඇත.

සිවිල් සමාජය, පුද්ගලික අංශයෙන් අපේක්ෂා කෙරෙනුයේ සේවා සහ සැපයුම් සඳහා සාධාරණ මිලක් පැවතීම, සේවා පුළුල් කිරීම හා ප්‍රමාණවත් පරිදි සැපයුම් ලබාදීම, සේවා හා සැපයුම්වල ගුණාත්මක තත්වය හා ආර්ථික කාර්යක්ෂමතාව යනාදියයි.

අනෙක් අතට සිවිල් සමාජය තුළින් රජය අපේක්ෂා කරන්නේ, රජයේ හා පුද්ගලික අංශයේ කටයුතු පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම, සිවිල් සමාජ සහභාගිත්වය සහ උසස් සමාජ හර පද්ධතියක් පවත්වාගෙනයාමයි.

එසේම, පුද්ගලික අංශය තුළින් රජය අපේක්ෂා කරනුයේ, තරඟකාරීව හැසිරීම, ආර්ථික කාර්යක්ෂමතාව සහ නීති හා රෙගුලාසිවලට අනුගත වීමයි.

## ප්‍රශස්ථ පාලනය දුර්වල වීමට හේතු

### දූෂණය

ප්‍රශස්ථ පාලනයක් යනු දූෂණයෙන් තොරවීම යන්නට වඩා පුළුල් අරුතක් ගෙන දෙන්නක් වුවත්, බලය අනිසි ලෙස යොදා ගැනීම ඇතුළු විවිධාකාර දූෂණයන් පාලනයේ ප්‍රශස්ථතාවය බිඳ දමන ප්‍රබල සාධක වේ.

### පාරදෘෂ්‍යතාවය නොමැතිවීම

රජයේ ගනුදෙනුවලදී, විශේෂයෙන්ම මහා පරිමාණ මිළදී ගැනීම් හෝ පුද්ගලිකරණ කටයුතුවල ප්‍රමාණවත් පාරදෘෂ්‍යතාවයක් නොමැතිවීමද වැදගත් සාධකයකි.

### දේශපාලන ක්‍රමය

1978 ව්‍යවස්ථාවේ ප්‍රතිඵලයක් වශයෙන් බිහිවූ අද පවත්නා දේශපාලන ක්‍රමයේ පවතින දුර්වලතා හේතුවෙන්, අක්‍රමික තත්වයන්ට එකඟවීමට සිදුවීම, ප්‍රජාතාන්ත්‍රික නොවන හා ක්‍රම විරෝධී මැතිවරණ ගිවිසුම් බිහිවීම වැනි දූෂණයට හා ගැටුම්කාරී තත්වයන්ට පොළඹවන සුළු දේශපාලන සංස්කෘතියක් බිහිවී ඇත. මෙම තත්වයට හේතුකාරකවූ දේශපාලන ක්‍රමයේ පවතින දුර්වලතාවයන් අතර මනාප ඡන්ද ක්‍රමය, සැළසුම් සහගත නොවූ බලය බෙදාහැරීම හා පාර්ලිමේන්තුවේ බලතුලනය සුළු පක්ෂ සතුව පැවතීම ප්‍රධාන තැනක් ගනු ඇත.

### මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණය

අද පවතින මැතිවරණ ක්‍රමය 1978 එක්සත් ජාතික පක්ෂ ව්‍යවස්ථාවෙන් බිහිකරන ලද අංග විකලවූ දරුවෙකි. මෙම ක්‍රමය අද ප්‍රජාතන්ත්‍රවාදයට මෙන්ම රටේ සාමයට ද විශාල තර්ජනයක් වී ඇත. එමනිසා මෙම මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කළයුතුයැයි අපි යෝජනා කරමු. අපගේ යෝජනාව අනුව මැතිවරණයකදි එක් එක් පක්ෂය දිස්ත්‍රික්කයක ලබා ගන්නා ඡන්ද ප්‍රමාණයට අනුපාතිකව මුළු මන්ත්‍රීවරුන්ගෙන් සියයට 50 ක් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් තේරී පත් වෙති. ඉතිරි සියයට 50 පත් කෙරෙනුයේ ඡන්ද ව්‍යාපාර

මගින් පාර්ලිමේන්තුවට යා නොහැකි විද්වතුන් හා විවිධ ක්ෂේත්‍රවල නායකයින් ය. මේ අය ජාතික ලැයිස්තුවක් මගින් පත්කළ හැකි වැඩ පිළිවෙලක් සකස් කෙරේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## රාජ්‍ය ආයතන දේශපාලනීකරණය වීම

විශේෂයෙන්ම රජයේ සේවකයන්ගේ බඳවා ගැනීම්, උසස්වීම් හා මාරුකිරීම් සඳහා වන දේශපාලන ඇඟිලි ගැසීම් රාජ්‍ය ආයතන දේශපාලනීකරණය වීමේ ප්‍රබල හේතුවක් වී ඇත.

## රාජ්‍ය අංශයේ දුර්වලතා

රාජ්‍ය සේවයේ කළමනාකරණ හා ප්‍රතිපත්ති සම්පාදන හැකියාවේ පවතින ඌනතාවය නිසා රාජ්‍ය අංශය දුර්වල වී ඇත.

## පූර්ණ වගකීමක් නොමැතිකම

බොහෝ අවස්ථාවලදී රජය පූර්ණ වගකීමක් පවත්වාගෙන යාමට අසමත් වී ඇත. මෙය ප්‍රශස්ථ පාලනය සම්බන්ධයෙන් ප්‍රබල ගැටළුවකි.

## මාධ්‍ය ගරුත්වය බිඳවැටීම

ස්වකීය පටු අභිමතාර්ථයන් සපුරා ගැනීම මුල්කොට ගත් පිරිසක් විසින් මාධ්‍ය හැසිරවීමේ තත්වයක් උදාවී තිබීම නිසා මාධ්‍ය ගරුත්වය පිරිහී ගොස් ඇති අතර, ප්‍රශස්ථ පාලනයක් සඳහා මාධ්‍යයෙන් සිදුවිය යුතු අති විශාල මෙහෙවර ඉටු නොවන තත්වයක් උදාවී ඇත. මාධ්‍ය සතු ජාතික මෙහෙවර අමතක වී ගොස් ඇත.

## නියාමන දුර්වලතා

රාජ්‍ය අංශය මගින් සපයනු ලබන උපයෝගිතා හා යටිතල පහසුකම් සැපයීමේදී බොහෝවිට නිසි නියාමන ක්‍රමයකට යටත් වී නැත. එසේම පුද්ගලික අංශයේ

විශේෂයෙන්ම ඒකාධිකාරී ස්වභාවයක් උසුලන ව්‍යාපාරික කටයුතු වලදී, නිසි නියාමන ක්‍රමයකට යටත් නොවීමේ දුර්වලතා තිබීමද ප්‍රශස්ථ පාලනයට බාධාවක්ව පවතී.

## නීතිරීති ප්‍රමාණවත් නොවීම

පවතින සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නීති හා රෙගුලාසි රාමුව සමගාමීව වර්ධනය නොවීම ප්‍රශස්ථ පාලනයට එරෙහි සාධකයක් වශයෙන් හඳුනාගෙන ඇත.

## සාරධර්ම පිරිහීම

ගෝලීයකරණය හා විවෘත ආර්ථිකය හරහා මෙරටට ගලා ආ විදේශීය පහත් සංස්කෘතික ප්‍රවාහයේ ග්‍රහනයට හසුවීම හා පාලක පන්තියේ ඇතැම් කොටස් බටහිරට ගැතිවීම සහ රටතුළ තිබූ ශිපණකාරී තත්වය නිසා පසුගිය කාලය තුළ සමාජ හර පද්ධතිය බිඳවැටීම, ප්‍රශස්ථ පාලනය පිරිහීමට බලපෑ ප්‍රබල හේතුවක් වශයෙන් සැළකිය හැකිය.

## ප්‍රශස්ථ පාලන මූලධර්ම

ප්‍රශස්ථ පාලනය පහත දැක්වෙන මූලධර්ම මත රඳා පවතිනු ඇත.

- තිසි ආකාර නියෝජනයක් සහිත වගකිවයුතු රජයක් පැවතිය යුතුය.
- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහිත, සහජීවනයෙන් යුත් බහු ජාතිය ශක්තිමත් සිවිල් සමාජයක් පැවතිය යුතුය.
- සක්‍රීය ආයතන ( good institutions) බිහිකිරීම - පුද්ගලයින්ගේ සහ සංවිධානයන්හි ක්‍රියාකාරකම් පාලනය කිරීමට මෙන්ම ඔවුන් අතර පවතින වෙනස්කම් විසඳා ගැනීම සඳහා අවශ්‍ය වන නීති පද්ධතියක් පවත්වාගෙන යාම
- අපක්ෂපාති හා සඵල නීති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් නීතියේ ආධිපත්‍යය සහතික කිරීම
- රාජ්‍ය හා ව්‍යාපාර ආයතන ක්‍රියාවලියන් තුළ ඉහළ මට්ටමක පාරදෘෂ්‍යතාවයක් හා පූර්ණ වගකීමක් පැවතීම.

- දේශපාලනඥයන්ගේ හා රාජ්‍ය සේවකයන්ගේ ආචාරශීලි හැසිරීම තහවුරු කිරීම
- අවංකභාවයකින් හා උසස් කුසලතාවයන්ගෙන් යුතු පුද්ගලයින් විසින් ඉහළ තනතුරු හොබවනු ලැබීම.

## ප්‍රශස්ථ පාලන අපේක්ෂාවන් ඉටුකර ගැනීමේ උපාය මාර්ග

ප්‍රශස්ථ පාලනයක් සහතික කරනු වස් පහත දැක්වෙන උපාය මාර්ග අනුගමනය කරනු ඇත.

1. මනා ආර්ථික කළමනාකරණය සහ පූර්ණ වගකීම

   ප්‍රමුඛ ආර්ථික අංශයන් සඳහා වෙන්කරනු ලබන සම්පත් නිසි පරිදි යෙදවීම හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පූර්ණ වගකීම එම අංශ භාර දේශපාලන හා විධායක නායකත්වයට පවරනු ඇත. ප්‍රමුඛ ආර්ථික අංශ ලැබූ ප්‍රගතිය මත පදනම් කර, සම්පත් වෙන් කරනු ලැබේ. වර්ධන වේගය සාක්ෂාත් කරගත් විට ඒ සඳහා අමතර දිරිගැන්වීමක් කරනු ඇත. ප්‍රමුඛ ආර්ථික අංශවලට වාර්ෂික වර්ධන ඉලක්කයන් නියම කරනු ලබන අතර, ප්‍රගතිය ඇගයීමේ කාර්යභාරය සැළසුම් කොමිසමට පවරනු ලැබේ. සාර්ථක අන්දමින් ඉලක්ක ප්‍රතිඵල ලඟාකර ගැනීමට අපොහොසත්වූ දේශපාලන හා විධායක නායකත්වයට විරුද්ධව නිසි පියවර ගනු ඇත.

2. ඉහළ තනතුරු සඳහා ඉතා අවංක හා ප්‍රවීන නිලධාරීන් පමණක් පත් කිරීම

   කැබිනට් ඇමතිවරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ඉහළ මට්ටමේ දේශපාලන හා විධායක තනතුරු සඳහා ඉතා අවංක හා ප්‍රවීන පුද්ගලයින් පමණක් පත් කරනු ඇත. තමන් භාරව සිටින අංශය මෙහෙයවන ආකාරය පිළිබඳ ඉදිරි දර්ශනය හා වැඩසටහන අදාල තනතුර භාර ගැනීමට පෙර ඔවුන් විසින් ඉදිරිපත් කළ යුතුය. අමාත්‍ය තනතුරු හැර අනෙකුත් තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් තෝරා ගැනීම සඳහාවූ පාර්ලිමේන්තුවේ

උසස් තනතුරු සඳහා පුද්ගලයන් තෝරීමේ කමිටුව සිවිල් සමාජය නියෝජනය වන පරිදි පුළුල් කරනු ඇත.

3. නව මුහුණුවරකින් යුත් රාජ්‍ය සේවයක්

රටෙහි ගොඩ නැගෙමින් පවතින දේශපාලන, ආර්ථික හා සමාජ සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සේවය කිරීමට හැකියාවක් හා දක්ෂතාවයන් සහිත අංශයක් බවට රාජ්‍ය සේවය පත් කරනු ඇත. එහි සියළු කටයුතු මහජන ශුභසිද්ධිය මුල්කොට ගතයුතුය යන සිද්ධාන්තය මත පදනම් වනු ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම, ජනතාවගේ සාරධර්මවලට ගරු කිරීම හා අනුකූලවීම, දේශපාලන ප්‍රමිතීන්, වෘත්තීය තත්වයන් හා ජනතා අභිවෘද්ධිය පෙරදැරිව කටයුතු කළ යුතුය.

4. දූෂණය තුරන් කිරීමට ප්‍රමුඛතාවයක් දීම

ඉහත සඳහන් කළ ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමය මත ගොඩනැගුනු වගකීම් පැවරීමේ ක්‍රියාදාමය තුළින් දූෂණය අවම කිරීම මූලික උපාය මාර්ගයක් වනු ඇත. සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම, නාස්තියෙන් තොරව සම්පත් යොදාගැනීම හා කාර්යක්ෂමතාවය මේ අනුව රුඳී පවතිනු ඇතැයි මෙහිදී උපකල්පනය කරනු ලැබේ.

ඊට අමතරව, රාජ්‍ය/පෞද්ගලික ක්‍රියාදාමයන් සහ රාජ්‍ය / පෞද්ගලික ගනුදෙනු වලදී සිදුවන දූෂණ හා අකාර්යක්ෂමතා විමර්ශනය කොට මහජනතාව ඉදිරියේ එළි දැක්වීම සඳහා අවශ්‍ය නීතිමය බලතල සහිත මහජන කවුන්සිලයක් හෙවත් සභාවක් ( public council) පිහිටුවීමට අදහස් කෙරේ. යෝජිත කවුන්සිලයේ විමර්ශන කටයුතු වලදී සිවිල් සමාජයේ ක්‍රියාශීලී සහභාගිත්වය ලබා ගැනීම සහතික කරනු ඇත. සමාජයේ විවිධ අංශයන් නියෝජනය වන පරිදි සමාජ පිළිගැනීමක් සහිත පුද්ගලයන්ගෙන් එම සභාව සමන්විත වනු ඇත. මෙම ආයතනයේ කටයුතු පූර්ණ විවෘත භාවයකින්ද යුක්ත වනු ඇත.

දූෂණය පිටුදැකීම සඳහා පහත දැක්වෙන අමතර උපාය මාර්ගයන්ද අනුගමනය කරනු ලැබේ.

අ. මහජන දේපල අයථා අන්දමින් අත්සතු කිරීම, පෞද්ගලික පරිහරණයට යොදා ගැනීම, පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගැනීම, අයථා අන්දමින් මුදල් ඉපයීම, දේපල ඉපයීම වැනි කටයුතුවලට වගකිවයුත්තන් විශේෂ අධිකරණයක් ඉදිරියට පමුණුවා විභාග කිරීම.

ආ. කිසියම් පැවරීමක්, ටෙන්ඩරයක්, සේවා සැපයීමක්, මිලදී ගැනීමක්, කොන්ත්‍රාත්තුවක්, ගණුදෙනුවක් හෝ පවරා ගැනීමක් හෝ ගිවිසුමක් පිළිබඳව නීතියට පටහැනිව හෝ අයථා පරිදි අනුමත පරිපාටියට බාහිරව කටයුතු කිරීම හෝ සිදු කිරීමට සූදානම් කිරීමක් පිළිබඳව කෙරෙන පැමිණිල්ලක් වහා පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පූර්ණ බලතල සහිත පස් දෙනෙකුගෙන් යුත් විමර්ශන කමිටු 3 ක් ජනාධිපතිනිය යටතේ පිහිටුවනු ඇත. ඊට මහජන නියෝජිතයින් ද ඇතුලත් කරනු ලැබේ.

5. දූෂණය පිටුදැකීම සඳහා දැනටමත් පිහිටුවා තිබෙන ආයතනයන්හි ස්වාධීනත්වයද, නිසි ක්‍රියාකාරිත්වයද තවදුරටත් සහතික කරනු ඇත.

6. සිවිල් සමාජය විසින් පුද්ගලික අංශය කෙරේ තබා ඇති අපේක්ෂාවන් ඉටුකර ගැනීම පහසුකර ගැනීම පිණිස ශක්තිමත් හා ස්වාධීන නියාමන යාන්ත්‍රනයක් ගොඩ නගනු ඇත.

6. ප්‍රමාණවත් සමාජ්‍ය වගකීමක් සහිත ස්වාධීන මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීමට සුදුසු පසුබිමක් සකසනු ඇත.

8. දූෂිත ක්‍රියාමාර්ග අධෛර්යමත් කෙරෙන පිරිසිදු දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ව්‍යවස්ථා සංශෝධන ඇතුළු පුළුල් දේශපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ඇත. මේ සඳහා සියළු දේශපාලන පක්ෂවල සම්මුතියක් ගොඩනගා ගැනීමට පියවර ගනු ඇත.

9. ඇමතිවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සහ සියළු දේශපාලන නියෝජිතයින්ගේ ආචාරශීලී හැසිරීම සහතික කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

ඉදිරියේදී පිහිටුවනු ලබන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් යටතේ ප්‍රශස්ථ පාලනයට අදාළ ඉහතකී ප්‍රතිපත්ති ක්‍රියාවට නංවනු ඇතැයි අපි ප්‍රකාශ කර සිටිමු.

**************

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# 6. නීතිය හා සාමය සුරැකෙන සමාජයක්

සාම ක්‍රියාදාමයේ අනුහසින් යුද්ධය නතරවී ඇති බවටත් දැන් බියෙන් සැකයෙන් තොරව ජීවත්විය හැකි බවටත් එක්සත් ජාතික පෙරමුණු රජය පුරසාරම් දොඩයි. එහෙත් යථාර්තය එයට හාත්පසින්ම වෙනස්ය. උතුරේත්, දකුණේත් දේශපාලන ඝාතන වැඩිවන්නට පටන්ගෙන තිබේ. උතුරු නැගෙනහිර ප්‍රදේශවලදී එල්ටීටීඊ ය තමන්ට විරුද්ධ දේශපාලන මතධාරීන් මරා දමනු ලබන අතර, දකුණේ ප්‍රදේශවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ සෙසු විපක්ෂ කණ්ඩායම්වලින් තේරීපත්වූ ජනතා නියෝජිතයින් හා ක්‍රියාකාරිකයන් මරාදැමීමේ කාර්යය, එක්සත් ජාතික පෙරමුණට සම්බන්ධ පාතාල මැරයන් භාරගෙන ඇත.

පාලන බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදු පෙරමුණු රජයෙන් ගිලිහීයාමෙන් අනතුරුව, සාපරාධී විෂම චක්‍රය අති ධාවන වේගයෙන් ක්‍රියාත්මක වන බව ඉතා පැහැදිලිය. අග නගරයේ අධි ආරක්ෂිත කලාපය හෝ ස්වකීය නිවහන හෝ විරුද්ධ පක්ෂයේ දේශපාලඥයන්ට මරුකැදවන ස්ථාන බවට පත්වී ඇත. දැනට සිදුවෙමින් පවත්නා දේශපාලන ඝාතනවලින් එම තත්ත්වය මැනවින් සනාථ වන්නේය.

නගරයේ මෙන් ම ඈත පිටිසර ගම්මානයේ ත් මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, ළමා අපරචාර, පැහැරගැනීම්, මංකොල්ලකෑම් යනාදිය දිනෙන් දිනම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. කොන්ත්‍රාත් මිනීමරුවෙකු ඇතැම්විට රු. 10,000 වැනි මුදලකට කුලියට ගත හැකිය. අපරාධ පිළිබඳ ලොමුදැහැගන්වන තොරතුරුවලින් දිනපතා පුවත්පත් පිරී තිබේ. අහිංසක පවුල් සහමුලින් නිදි ඇඳේදීම මරාදැමූ අවස්ථා එමටය. ගෙයින් ගෙට, දොරින් දොර, මරණ භය හොල්මන් කරයි. රටතුළ දක්නට ලැබෙනුයේ සාරධර්ම සෝදා පාලුවකි. මුළු මහත් දේශයත්, ජාතියත් පරිහානියට පත්වෙමින් ඇත.

පසුගිය වසර එකහමාරක පමණ කාලයේ සිට නීතිය හා සාමය දැවැන්ත පිරිහීමකට පත් වී තිබේ. 2001 වසරේදී පැවැත්වූ මැතිවරණයෙන් පසු, ආණ්ඩු පක්ෂයේ ආධාරකරුවන් විපක්ෂයේ හිතවතුන්ට එරෙහිව දියත් කළ ප්‍රචණ්ඩ සිද්ධීන් සංඛ්‍යාව 3000 ද ඉක්මවයි. ඒ අතර, අමු අමුවේ මරාදැමූ සංඛ්‍යාව 60 දෙනෙකි. එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුව යටතේ

ඇතිවී තිබෙන මෙම බරපතල සමාජ උවදුර කෙරෙහි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැඩි විමසිල්ලෙන් පසුවන අතර, මෙම ඝාතන රැල්ල වහාම නතර කළයුතු යැයි බලකර සිටී.

මෙම සිද්ධීන් වළක්වාලිය හැකි අවස්ථාවලදී, එසේ කිරීමට හෝ පසුව නිසි පරිදි පරීක්ෂණ පවත්වා වුදිතයන් නීතියේ රැහැනට හසුකර ගැනීමට හෝ පොලීසිය අසමත් විය. නීතිය හා සාමය බිඳවැටී අයුක්තියත් අසාධාරණයත් රජයන වටපිටාවක් නිර්මාණය වී ඇත. පොලීසිය ප්‍රමුඛ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන මෙම රජය විසින් දේශපාලනීකරණයට හසුකර ඇති අතර, දේශපාලනය අපරාධකරණයක ස්වරූපයට පරිවර්තනය කර තිබීම මේ තත්ත්වයට ප්‍රධාන හේතුව ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සලකයි.

සාමාන්‍යයෙන් අපරාධ සිදු නොවන සමාජයක් මිහිපිට නැත. ජනගහන වර්ධන වේගය හා සමගාමීව, අනුශාංගික වෙනත් සමාජ ආර්ථික හේතූන් මත ඕනෑම සමාජයක අපරාධ සංඛ්‍යාවේ සාමාන්‍ය වැඩිවීමක් දක්නට ලැබීම පොදු ලක්ෂණයකි. නො වැලැක්විය හැකි එවැනි අපරාධ පොලීසියේ ආකාර්යක්ෂමතාව කෙරෙහි සුවිශේෂ බලපෑමක් කිරීමට හෝ සමාජ සංස්ථා ක්‍රියාදාමය අඩාල කිරීමකට හෝ හේතුවන බවක්, අපි නොකියමු. අද දක්නට ඇත්තේ සපුරා වෙනස් ප්‍රවණතාවයකි.

මතු දැක්වෙනුයේ එම ප්‍රවාණතාවයට හේතුවූ සාධක කිහිපයකි.

(අ) කලින් හිතමතා සැළසුම් කළ අපරාධ සංඛ්‍යාව වැඩිවීම

(ආ) ඇතැම් පොලිස් නිලධාරීන් ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයන්ගේ සුවච ගෝලයන් බවට පත්වීම හේතු කොට ගෙන එම දේශපාලඥයන්ටත්, ඔවුන්ගේ හෙංචයියලාටත් එරෙහිව නිසි පරිදි නීතිය ක්‍රියාත්මක නොවීම.

(ඇ) සන්නද්ධ හමුදා හැර ගොස් නිදැල්ලේ හැසිරීම නිසා අපරාධ වලට යොමුවූ සොල්දාදුවන්ගේ වැඩිවීම.

ඒ අතර ඇතැම් දේශපාලඥයන් පමණක් නොව ඔවුන්ගේ පා සෙවනේ වැඩුනු බත්බැලයන් පවා පොලිස්ස්ථානවලට කඩාවැදී, බලහත්කාරයෙන් තම හිතවත් චූදිතයන් නිදහස් කරගත් අවස්ථා නිතර අසන්නට ලැබේ. දේශපාලකයන් ස්වකීය මැර බලය පවත්වාගෙන යෑම සඳහා මැර කල්ලි උපයෝගි කරගන්නා අතර, ඇතැම් පොලිස් නිලධාරීන් දේශපාලන වාසි තකා මැරයන්ගේ කුළුපග හිතවතුන් බවට පත්ව ඇත. මැතිවරණ සමයේ දේශපාලඥයන්ට උදව් කිරීමෙන් ද විරුද්ධ පක්ෂයට හිරිහැර කිරීමෙන් ද, දේශපාලනඥයන්ගෙන් උදව් ලබාගැනීමට ඔවුහු පෙළඹෙති. එහිලා ක්‍රියාත්මක මැර කණ්ඩායම්වලට යථෝකත පොලිස් නිලධාරීන්ගේ අනුග්‍රහය ලැබේ.

අච් ගලා ඒම වැළැක්වීම, අපරාධකරුවන් මර්ධනය කිරීම, අනලස්ව යුක්තිය පසිඳලීම, අපරාධයට සරිලන දඩුවම් ලබාදීම, යනාදී මේ සියල්ලටම අවශ්‍ය වන්නේ දේශපාලන ගැති බැවින් තොර අපරාධකරුවන් හා අනියම් සබඳතා නොමැති අප්‍රමාදව ක්‍රියා කරන නීතිගරුක පොලිසියකි.

ඒ අතර දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩිවන රිය අනතුරු සංඛ්‍යාව ද අතිමහත්ය. වර්තමානයෙහි වෙනත් අනතුරු වලින් මිය යන සංඛ්‍යාවට වඩා වැඩි සංඛයාවක් රිය අනතුරුවලින් මිය යති. නීතිය නිසි අයුරු ක්‍රියාත්මක නොවීම හේතුකොට ගෙන පොදු ජනතාව අතර මෙන්ම රියදුරුන් අතර ද විනය පිරිහීම එයට හේතුව බව ඉඳුරාම කිව හැකිය. එහිලා නිවැරදි කළයුතු හේතු සාධක අතර, පහත දැක්වෙන කරුණු ප්‍රමුඛ වන්නේය.

1. පර්ලිමේන්තු නියෝජිතයින් සහ දේශපාලන ක්ෂේත්‍රයේ වෙනත් බලවතුන් නීතිය දඩම්මා කරගැනීම වැළැක්වීම.
2. අපරාධ නීති පද්ධතිය, අධිකරණය, පොලිසිය හා බන්ධාගාර යනාදිය විමර්ශනය කොට ප්‍රතිශෝධනය කිරීම.

<u>දේශපාලනඥයන් සහ නීතිය</u>

ස්වකීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ දේශපාලඥයන් නීතිය කඩකරන විට, ඔවුන් විනය ගරුක වගකිවයුතු පිරිසක් බවට

පත්කිරීම දේශපාලන පක්ෂවල මෙන්ම පක්ෂ නායකත්වයේද වගකීම විය යුතුය. දේශපාලඥනයන්ගේ අත්තනෝමතික ක්‍රියා පාලනය කිරීමටත්, පොලිසියට මෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේ සෙසු ආයතන වලට කැරෙන බලපෑම් වළක්වාලීමටත්, චරියා ධර්ම පද්ධතියක් හඳුන්වා දීම ද, අතිශයින්ම වැදගත්ය.

මෙයට පිළියම් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනය කමිටුවක් පත්කිරීමට කටයුතු කරනු ඇත. පක්ෂ නායකත්වය විසින් තෝරාගනු ලබන, එසේම පක්ෂ දේශපාලනයට නැඹුරු නොවූ, විශ්‍රාමික විනිසුරුවරුන්ගෙන්, රජයේ උසස් තනතුරු හෙබවූ විශ්‍රාමික පරිණත පුද්ගලයන්ගෙන් සහ පුමුඛ පෙළේ නීතිඥයන්ගෙන් ද එම කමිටුව සමන්විත වන්නේය. හුදෙක් විනය කඩකිරීම් අරභයා ම ක්‍රියාකරන සෙසු කමිටුවලට වඩා මෙය වෙනස් වූවකි. නීති උල්ලංඝනය කරන දේශපාලනඥයින්ට එරෙහිව ක්‍රියාකිරීමේ බලය ද එයට තිබීම, එහි ප්‍රබලත්වයට හේතුවකි. ඕනෑම පුරවැසියෙකු විසින් දේශපාලඥයකුට එරෙහිව ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලක් පරීක්ෂා කිරීමේ බලය එම කමිටුව සතු වන්නේය. පාර්ලිමේන්තුව නියෝජනය කරන සෑම දේශපාලන පක්ෂයකින්ම තෝරා, ජනාධිපති විසින් පත්කැරෙන එම කමිටුව කථානායකවරයාගේ සෘජු පාලනය යටතේ ක්‍රියාත්මක වනු ඇත.

අපරාධ නීති පද්ධතිය.

අපරාධ නීති පද්ධතියේ දක්නට ඇති ඌණතාවන්, සමාජයේ නීතිය හා සාමය පවත්වාගෙන යාම කෙරෙහි තදින්ම බලපාන බව නොකිවමනාය. අපරාධ නීති පද්ධතිය මතු දැක්වෙන ආයතනයන්ගෙන් සමන්විතය.

1. අධිකරණය
2. පොලීසිය
3. බන්ධනාගාරය

සමස්ත අපරාධ නීති පද්ධතියම විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කරනු සඳහා ජනාධිපති කොමිසමසක් පත්කළයුතු යැයි ද අපි යෝජනා කරමු. එක් එක් ආයතනය විමර්ශනය කරනු සඳහා පත් කර ඇති වෙනත්

කොමිසන් සභා කොතෙකුත් තිබිය හැකිය. එහෙත් සමස්ත ආයතන පද්ධතියම ආවරණය වන, මෙවැනි බලතල සහිත කොමිසන් සභාවක් පත්කිරීම වඩාත් මැනවැයි නිගනමනය කළේ ඒ ඒ ආයතනවල පරිපාලනමය හා ව්‍යුහාත්මක අංශවලට වඩා නීතිය හා සාමය පිළිබඳව සුවිශේෂ අවධානයෙන් යුතුව කෙරෙන විමර්ශනයක් යථෝක්ත කොමිසන් සභාවෙන් අපේක්ෂිත බැවිනි.

අධිකරණය

යුක්තිය පසිඳලීමේ දී දක්නට ලැබෙන ප්‍රමාදය, පවත්නා සමස්ථ නීති පද්ධතියටම බලපාන්නේය. ජනතාව තුළ අධිකරණ ක්ෂේත්‍රය කෙරෙහි පවත්නා විශ්වාසය බිඳ වැටීමට එය හේතුවකි. ඇතැම් විට එහි ප්‍රතිඵලය වශයෙන් අනලස්වම කෙටි මගකින් යුක්තිය සොයා යන ජනතාව, නීතිය අතට ගෙන ක්‍රියාකිරීමට පෙළඹෙන අවස්ථා ද විරල නොවේ.

පොලීසිය.

පොලීසිය දේශපාලනීකරණයට හසුකිරීමත්, දීර්ඝ කාලයක් තිස්සේ පොලීසිය සාධාරණ ක්‍රියාපටිපාටින්ගෙන් බැහැරවීමත්, දැනට පොලිසියේ පවත්නා දූෂණ හා අකර්යක්ෂතාවයනට හේතුවකි. මතු දැක්වෙන ක්ෂේත්‍රයන් අලලා ප්‍රතිශෝධනයන් කොට වඩාත් නිවැරදි සාධාරණ ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීම වැදගත් යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශ්වාස කරයි.

(අ) උසස්වීම්
(ආ) මාරුවීම්
(ඇ) පොලිස් ස්ථාන / පොලිස් උපසේවා ස්ථාන/ පොලිස් දිස්ත්‍රික්ක හා පොලිස් ප්‍රදේශභාර පත්කිරීම්
(ඈ) ප්‍රයෝගික මට්ටමේ අපරාධ විමර්ශන කටයුතු,
(ඉ) පොලිසියට විරුද්ධව ලැබෙන පැමිණිලි විභාග කිරීමට සුදුසු යාන්ත්‍රණයක්

" පොලිසිය මහජනතාවය මහජනතාව පොලිසියයි " , යන සංකල්පය පෙරදැරි කරගනිමින් පොලිසිය ප්‍රජා සංවිධානයක් බවට පරිවර්තනය කිරීමට අප පක්ෂය අපේක්ෂා කරයි. පොලිසියත් ප්‍රජාවත් අතර, සහසම්බන්ධතාව වර්ධනයවූ තරමට ම අපරාධ අවම කරමින්, රටේ නීතියත් සාමයත් යළිදු ස්ථාපනය කළ හැකියැයි අපි තරයේ විශ්වාස කරමු.

" පොලිස් - ප්‍රජා උපදේශක කමිටු " පිහිටුවාලීමට ව්‍යවස්ථාමය පියවර ගැනීමට ද අපි යෝජනා කරමු. අවශ්‍ය තන්හි නීති සංශෝධනය කිරීමට යෝජනා කිරීමේ අයිතිය ද ඉහත කී කමිටුවලට පැවරේ. තම තමන්ගේ ප්‍රදේශවල පවත්නා නීතිය හා සාමයටත් අදාල කරුණු හා ගැටළු පිළිබඳ ප්‍රදේශවාසී ජනතාව දක්වන ආකල්ප - විකල්ප සම්බන්ධයෙන් අදාල පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමටත්, එම කරුණු නීත්‍යානුකූලව නිරාකරනය කළයුතු ආකාරය පිළිබඳව අදහස් දැක්වීමටත් හැකි ප්‍රජා සහභාගීත්වයක් අවශ්‍ය බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතයයි.

ඉහතින් දැක්වුණු ප්‍රතිපත්ති පදනම් කරගනිමින් නීතිය හා සාමය සුරැකෙන සමාජයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැපවී සිටී.

***********//**********

ජනාධිපති ලේකම් කාර්යාලය
2 6 AUG 2023
පුස්තකාලය
SCANNED